# රණවිරුවා

2019 දෙසැම්බර් • 212 කලාපය



## උපන් බිම සුරකින පුතුන්ගේ සම්ප්‍රාප්තිය

ලත් නිදහසට එරෙහිව සතුරන් දසත
හිත්පිත් නොමැති ලෙස ඔසවන විට සුරත
උත්තම පුතුනි පණ මෙන් සුරකින දියත
ගත් අසිපතින් සිඳ මිස නොහෙළනු පහත



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.



# අනාගත උරුමකරුවන්ගේ අභිමානවත් විසිරයාම







දෙස සුරැකීමේ අභීත මෙහෙවරට කැපවූ කෙඩෙට් නිලධාරීන් 321 දෙනෙකුගේ විසිරයාමේ උත්සවයක් පසුගිය දෙසැම්බර් 21 දින දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන්, එම අභිමානවත් අවස්ථාවට ප්‍රධාන අරාධිත අමුත්තා ලෙස ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන් සහභාගී විය.

ජාතියේ ආරක්ෂකයින් ලෙස කැපවූ එම පිරිසට නිත්‍ය කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 87, 87බී, ස්වේච්ඡා කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක - 59, ස්වේච්ඡා කෙඩෙට් නිලධාරිණී පාඨමාලා අංක - 16 සහ කෙඩෙට් නිලධාරිණී පාඨමාලා අංක - 17 ට අයත් පිරිස ඇතුළත් වූහ. ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) මේජර් ජෙනරාල් කමල් ගුණරත්න, යුද හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විසිරගිය අයවලුන්ගේ දෙමාපියන් ඇතුලු විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති යුද්ධ හමුදාවේ අනාගත උරුමකරුවන්ගේ එම අභිමානවත් විසිරයාම හා බැඳුණු විචිත්‍ර මතක සටහන් මෙහි දැක්වේ.





"දෙස බස රැස
සුරැකීම උදෙසා වූ ජාතික
මෙහෙවරට සිය තාරුණ්‍යය
එක්කළ වීර දූ පුතුන්ගේ
විසිරයාම එදින යුද හමුදා
විද්‍යාපීඨයට ගෙනදුන්නේ
සැබැවින්ම ආඩම්බරයකි.
සිය වගකීම උරමත දරමින්
යුද හමුදාවේ අභිමානය
සුරැකීමට ඔවුන් සිය පළමු
පා සටහන මෙලෙස තබනුයේ
තිස්වසරක යුදගිනි නිවාලූ
ලොව විශිෂ්ටතම හමුදාවක
අනාගත නියමුවරුන් ලෙසය"







# මිරිසවැටි පුදබිමෙහි රණවිරු සැමරුමක්







යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කෙරුණු ආගමික වැඩසටහන් මාලාවක් ඉකුත් දෙසැම්බර් 07 දින ඓතිහාසික මිරිසවැටිය මහා සෑ රදුන් අභිමුවදී පැවැත්විණ. නෙත් එෆ්.එම් ගුවන් විදුලි නාලිකාව සහ ගජබා රෙජිමේන්තු සාමාජිකයින්ගේ එකමුතුවෙන් සංවිධානය කෙරුණු එම පුණ්‍ය කටයුත්තේදී සාම්ප්‍රදායික බෙර, හේවිසි, පුරප්පට්ටු පෙරටු කරගනිමින් පැවති දර්ශනීය පෙරහැරකින් "කප්රුක" වැඩම කරවන ලදී.

පැවති ආගමික වතාවත් අතරතුර සංකේතාත්මකව පුරාණ රාජකීය චරිත නිරූපණය කරන රාජකීය නාට්‍යයක් සජීවීව වේදිකාගත කිරීමද විශේෂත්වයකි. මෙම උතුම් පිංකම සඳහා ගජබා රෙජිමේන්තු මූලස්ථානයේ නිලධාරීන් සහ සෙබලුන්ද සිවිල් සේවක මහතුන් විශාල පිරිසක්ද සහභාගී වූහ.







# ආරක්ෂක ලේකම්තුමාගේ සංචාරයන්...

ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා ඉකුත් දෙසැම්බර් 09 දින යුද්ධ හමුදා මූලස්ථානයේ සිය ප්‍රථම නිල සංචාරයේ නිරත විය. එහිදී කණ්ඩුල හස්තියා පෙරටු කොට ගනිමින් වර්ණවත් හමුදා ආචාර පෙළපාලියකින් පිදුම් ලැබූ එතුමන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් මහත් හරසරින් පිළිගනු ලැබීය. එහිදී ආරක්ෂක ලේකම් තුමන් එහි සියලු නිලධාරීන් අමතන්නට අමතක නොකළ අතර, ඔහුගේ එම සංචාරය යුද්ධ හමුදා මූලස්ථානයට ඉමහත් අභිමානයක් එක්කළ අවස්ථාවක් විය.









ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා සිය ධූරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව පසුගිය දෙසැම්බර් 12 දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ නිල සංචාරයක නිරත විය. එහිදී 14 ගජබා රෙජිමේන්තු භටපිරිස් වෙතින් පිරිනැමුණු සාම්ප්‍රදායානුකූල බුහුමන් පිළිගනිමින් එහි රණවිරු ස්මාරකයට පුෂ්පෝපහාර දැක්වූ එතුමන් ආරක්ෂක සේනා මූලස්ථානයේ සියලු නිලයින් අමතන්නටද අමතක නොකළේය. එම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන, ත්‍රිවිධ හමුදාධිපතිවරු, යාපනය ආරක්ෂක සේනා ආඥාපති, සෙසු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිලයින් ඇතුලු විශාල පිරිසක්ද එක්වූහ.

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය විවෘත කෙරේ...





යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරනු ලැබූ මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය ඉකුත් නොවැම්බර් 23 දින විවෘත කෙරිණ. එම අවස්ථාවට නාගානන්ද ජාත්‍යන්තර අධ්‍යයන ආයතනයේ උපකුලපති මෙන්ම ප්‍රධාන විධායක නිලධාරී පූජ්‍ය බොදාගම චන්දිම නායක හිමියන්ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය. එහිදී යුද්ධ හමුදාධිපතිතුමන් අතින් සමරු ඵලකය නිවාරණය කරන ලද්දේ මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේය.

නවීන පහසුකම් සහිත සිව් මහල් ඉදිකිරීමක් වූ එම මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු සේවා බළකායේ භට පිරිස්වල ශිල්පීය හැකියාවන් කදිමට විදහා පෑ මනස්කාන්ත නිමැයුමක් විය.



# ජාතික දැල්පන්දු තරඟාවලිය - 2019

කනිෂ්ඨ ජාතික දැල්පන්දු තරඟාවලියේ සමාරම්භක උත්සවය ඉකුත් නොවැම්බර් 30 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් කොළඹ ක්‍රීඩා අමාත්‍යංශ ටොරින්ටන් ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. එම කනිෂ්ඨ දැල්පන්දු තරඟාවලිය සඳහා දිවයින පුරා අවුරුදු 21 ට අඩු දැල්පන්දු ක්‍රීඩිකාවන් තරඟ කරනු ලබන අතර, අනාගතයේදී ජාතික සංචිතය ශක්තිමත් කිරීම සඳහා දක්ෂතා සහිත ක්‍රීඩිකාවන් තෝරාගැනීම තරඟාවලියේ අරමුණයි.

ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයේ සභාපති ලක්ෂ්මි වික්ටෝරියා මහත්මිය, පුහුණුකරුවන් සහ සංවිධායකයින් මෙන්ම ක්‍රීඩිකාවන් ගේ උණුසුම් පිළිගැනුම මධ්‍යයේ එම අවස්ථාවට සපැමිණි යුද්ධ හමුදාධිපතිතුමන් එහි සියලු තරඟකරුවන්ට සුබපැතුම් එක් කරන්නටද අමතක නොකළේය.









# ඉන්දීය නාවික හමුදා ප්‍රධානගේ සංචාරය....




සිව්දින සුහද සංචාරයක නිරත ඉන්දීය නාවික හමුදාවේ නාවික මාණ්ඩලික ප්‍රධාන අද්මිරාල් කරම්බීර් සිං පීවීඑස්එම් ඒවීඑස්එම් ඒඩීසී ඉකුත් දෙසැම්බර් 19 දින උදෑසන ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවී සුහද පිළිසඳරක නිරතවිය.

---



# ඉන්දීය ආරක්ෂක විශ්ලේෂක යුද්ධ හමුදාධිපති හමුවේ...

හමුදා හා යුදමය ගැටුම් පිළිබඳ ඉන්දියාවේ ආරක්ෂක විශ්ලේෂකයකු ලෙස සැලකෙන නිටින් ගොඛ්ලේ මහතා ඉකුත් දෙසැම්බර් 23 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. එහිදී පැවති සාකච්ඡාවේදී නව ජනාධිපතිතුමන් සිය ධූරයේ වැඩ භාරගැනීමෙන් පසු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පැවරි ඇති සුවිශේෂි කාර්යභාරය පිළිබඳව යුද්ධ හමුදාධිපතිතුමන් සිය ඉදිරි දැක්ම පැහැදිළි කළේය.

වර්ෂ 1983 සිට බහුමාධ්‍ය වාර්තාකරුවෙකු ලෙස කටයුතු කරන "භාරත් ශක්ති" සහ "එස්එන්අයි" හි ප්‍රධාන කර්තෘ නිටින් ගොඛ්ලේ මහතා, කතුවරයකු, මාධ්‍ය පුහුණුකරුවෙකු, ආරක්ෂක විශ්ලේෂකයෙකු, කථිකාචාර්යවරයෙකු මෙන්ම පර්යේෂකයකු ද වන අතර ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ නව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සමඟින් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමේ වරප්‍රසාදය ලද ප්‍රථම විදේශ මාධ්‍යවේදියාද විය.




# යුද්ධ හමුදා නත්තල් කැරෝල්...

යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් වාර්ෂිකව සංවිධානය කළ "නත්තල් කැරොල් ගී ප්‍රසංගය" ඉකුත් දෙසැම්බර් 10 දින සම්භාවනීය ආරාධිත අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් නෙලුම් පොකුන මහින්ද රාජපක්ෂ රඟහලේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස කොළඹ අගරදගුරු අති උතුම් පූජ්‍ය (ආචාර්ය) මැල්කම් රංජිත් පියතුමන් සහභාගී වූ අතර ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.

යුද්ධ හමුදා ගීතිකා කණ්ඩායම්, පාසල් ගීතිකා කණ්ඩායම්, පෞද්ගලික ගීතිකා කණ්ඩායම් සහ ජනප්‍රිය ගායක ගායිකාවන් රැසක් එම නත්තල් බැති ගී ප්‍රසංගය වර්ණවත් කරන ලදී. එම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණි සුජීවා නෙල්සන් මහත්මිය, හිටපු යුද්ධ හමුදාධිපතිවරු, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරිවරු, රදගුරු රෙක්ටර් පියතුමා, එඬේරමුල්ල ශාන්ත ජෝෂප් විද්‍යාලයේ ගුරුවරු මෙන්ම දේවගැතිවරුන්ගේ කන්‍යාරාමය, ද මැසනඩ් විද්‍යාලය ඇතුලු ස්ථාන රැසක් නියෝජනය කරමින් ද පිරිස් සහභාගි වූහ.





# විරුහිත් නිවූ සොඳුරු මොහොතක්...



රටේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා සටන් වැද රණක්ෂිතයට පත්ව මිහිඳු සෙත්මැදුර 1, 2, 3, රාගම රණවිරු සෙවණ සහ රෙජිමේන්තු මූලස්ථාන බළඇණි තුළ නේවාසිකව ප්‍රතිකාර ලබන විරෝධාර රණවිරුවන් 330 දෙනෙකු සඳහා ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ ඒකාකාරී බවින් මුදවාලීම පිණිස වූ රසවින්දනාත්මක වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 17 දින පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මිය එම සේවා වනිතා ඒකකය සමඟ එක්ව සංවිධානය කළ මෙම වැඩසටහනට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද එක්විය.



එහිදී එම රණවිරුවන් හට රීගල් සිනමා ශාලාවේදී ජනප්‍රිය චිත්‍රපටයක් නැරඹීමේ පහසුකම් සලසාදී හිල්ටන් හෝටලයේ දී රසවත් දිවා භෝජන සංග්‍රහයක් භුක්ති විඳීමට ද අවස්ථාව උදාකර දෙන ලදී. ජනප්‍රිය ගායක ගායිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු එම වර්ණවත් දිනය එකී රණවිරුවන්ට අමතක නොවන නැවුම් අත්දැකීමක් ගෙනදුන් අවස්ථාවක් විය.



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිණි රිද්මිලා සිල්වා මහත්මියගේ මඟපෙන්වීම මත සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, යුද සේවා ලේකම් මෙන්ම ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්පී ද සිල්වා වීඑස්වී යූඑස්පී එන්ඩීයූ අයිජී ද සහභාගී වූහ.

# සේවා වනිතා සේවාවේ සොඳුරු එකමුතුවක්...

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 35 වන වාර්ෂික මහ සභා රැස්වීම ඉකුත් දෙසැම්බර් මස 06 දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

ඉකුත් වසර 35 ක කාලය තුළ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ප්‍රගතිය වෙනුවෙන් අපරිමිත සේවාවක් ඉටුකළ හිටපු සභාපතිණියන්, ලේකම්වරියන් සහ විධායක සාමාජිකාවන් එහිදී වත්මන් යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිණියගේ ඇගයුමට බඳුන් විය.



# රණක්ෂිතයට පත් විරුවන් හමුවී...







යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය සුජීවා නෙල්සන් මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් සේවා බළකා සේවා වනිතා සාමාජිකාවන් පිරිසක් ඉකුත් නොවැම්බර් මස 22 දින අත්තිඩිය මිහිඳු සෙත් මැදුරේ සංචාරයක නිරත වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ එම සංචාරයේදී නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ඇති දැනුම වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළුවක්ද සංවිධානය කරන ලදී. ඉන් අනතුරුව අපොස (සා/පෙළ), 2019 ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වූ එම බළකායට අයත් නිලධාරීන් හා සෙසුනිලයන්ගේ දූ දරුවන් 23 දෙනෙකු වෙත ශිෂ්‍යාධාර හා පාසල් උපකරණ කට්ටල පිරිනැමීමද සිදු කෙරිණි.

# සංචාරයක මතක සටහන්...

මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතන අතරමැදි නිවස්නයේ වාට්ටු අංක 05 හි නඩත්තු කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් සිදුකරනු ලබයි. එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සහභාගි කරවා ගනිමින් සෑම වසරකම නත්තල් උත්සවයක්ද සේවා වනිතා ඒකකය මගින් පවත්වනු ලබයි. ඒ අනුව මෙවරද එම නත්තල් උත්සවය ඉකුත් දෙසැම්බර් මස 15 දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම රෝහල් වාට්ටුවේදී පවත්වන ලදී.





මෙම අවස්ථාවේ නත්තලේ අසිරිය ඔප් නංවමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකා "අධිරිද්ම" සංගීත කණ්ඩායම එම රෝගීන්ගේ මානසික සුවය සඳහා සංගීත රසාස්වාදය සපයන ලද අතර එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ද ගායනාවලට සහභාගි වීම සිත්ගන්නා අවස්ථාවක් විය. නේවාසික රෝගීන් වෙත ඇඳුම් පැළඳුම් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක් ලබාදීමටද එහි සේවා වනිතා ඒකකය කටයුතු යොදා තිබිණ. මීට අමතරව එම වාට්ටුව අලංකාරවත් ලෙස සැරසිලි කිරීමටද, නේවාසික රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා වූ නාන කාමරය ක්‍රමවත් ලෙස අලුත්වැඩියා කිරීමද සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා පොදුසේවා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය දීපා හඳුන්මුල්ල මහත්මිය, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සාමාජිකාවන් සහ සෙසුනිලයින් පිරිසක්ද සහභාගි වූහ.

## සංඥා බළකා සේවා වනිතා ශාඛාව...





ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තුව යටතේ රාජකාරී කරනු ලබන ජ්‍යෙකොනොනිවරුන් දෙදෙනෙකුගේ නිවුන් දරුවන් වෙනුවෙන් කිරිපිටි පරිත්‍යාග කිරීමක් ඉකුත් දෙසැම්බර් 14 දින එම බළකා සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් එක්ව සිදුකරන ලදී.

## ගජබා සේවා වනිතා ශාඛාව...





ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ ඉකුත් නොවැම්බර් 30 දින අභිමංසල 1 අනුරාධපුර සුවසහන මධ්‍යස්ථානයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුව දුක් සොයා බැලීම සඳහා රෝහල් සංචාරයක නිරත වූහ. එම සංචාරය අතරතුරදී නේවාසික රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා භාණ්ඩ පරිත්‍යාග කිරීමක්ද කළ අතර ඔවුන් රණවිරුවන් හට සහ එහි කාර්ය මණ්ඩලය වෙත තේ පැන් සංග්‍රහයක් හා දිවා ආහාර වේලක් පිරිනැමීමටද ක්‍රියා කළේය. එසේම ඔවුන්ගේ රසාස්වාදය උදෙසා නර්තන අංගයන්ගෙන් සමන්විත වූ සංගීතමය වැඩසටහනක්ද පවත්වන ලදී.

## සේවා බළකා සේවා වනිතා ශාඛාව...

6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය සහ යුද්ධ හමුදා සේවා බළකා සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන් ඉකුත් ඔක්තෝබර් 20 දින රාගම රණවිරු සෙවණෙහි සංචාරයක නිරත වූහ. එහිදී රණවිරු සෙවණෙහි ප්‍රයෝජනය සඳහා මුද්‍රණ පිටපත් යන්ත්‍ර 03 ක්ද, රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා පුද්ගලික භාණ්ඩ පරිත්‍යාග කිරීමක්ද සිදුකළ ඔවුන් එහි දරුවන් හට ප්‍රණීත දිවා ආහාර වේලක් ලබාදීමටද කටයුතු යොදන ලදී.






## ඇඳුම

ළදරු පාසලක් මගින් සත්තුවත්ත සහ මුහුද බැලීමට රැගෙන ගිය අධ්‍යාපන චාරිකාවක් ගොස් පැමිණි කුඩා පුතු තම පියා ඇමතීය.

**පුතා** - තාත්තෙ... තාත්තගෙ ඇඳුම් කොළඹ දාල ආවද?

**තාත්තා** - ඇයි පුතා එහෙම අහන්නෙ?

**පුතා** - "මහතුන්ගේ ඇඳුම් තිබේ" කියල කොළඹ රෙදි කඩේක බෝඩ් එකක් ගහල තිබ්බ... ඉතිං තාත්තගෙ නම මහතුන්නෙ....



## බයික් පැදීම



**පුතා** - තාත්තෙ... මට බයික් එකක් අරන් දෙනවද?

**තාත්තා** - ඇයි පුතේ දෙයියො උඹට කකුල් දෙකක් දීල තියෙන්නෙ මොකටද?

**පුතා** - එකක් බ්‍රේක් ගහන්ඩ... අනික ගියර් මාරු කරන්ඩ...

## හොරකම

**චමීර** - ඊයෙ හොරෙක් මගෙ බයික් එක අරගෙන ගියා... මන් ඌව අතටම අල්ල ගත්ත...

**නිමල්** - ඉතින් උඹ ඌට ගැහුවද?

**චමීර** - නෑ බං... ඉස්සරහ බ්‍රේක් පොඩ්ඩක් අඩුයි පරිස්සමෙන් පලයන් කියල කිව්ව...

## රෙදි සේදීම



**රෝසි** - වැස්සක් එන්ඩ වගේ...

**පීටර්** - ඉතිං කොහෙද ගෑනියේ පණ කඩාගෙන දුවන්නෙ?

**රෝසි** - රෙදි ටික... රෙදි ටික...

**පීටර්** - ඇයි අපේ රෙදි ටික වැලේද?

**රෝසි** - නෑ... හෝදන්න තියෙන අපේ රෙදි ටික වැලට දාන්න...



## අහවල් සායනය

**දොස්තර** - තමුසෙට මානසික ආතතියක් වගේ ඇති වුනාම මොකද කරන්නෙ?

**සිරිල්** - මම පන්සලට යනව ඩොක්ට...

**දොස්තර** - බොහොම හොඳයිනෙ... භාවනා කරන්නද යන්නෙ?

**සිරිල්** - නැහැ ඩොක්ට... මම පන්සලට ආපු මිනිස්සු ගලවල යන සෙරෙප්පු ටික ඔක්කොම කලවං කරල, එක එක පැතිවලට විසි කරල හැංගිලා බලන් ඉන්නව... අරුන් පිස්සො වගේ ඒවා හොයන දිහා බලන් හිටියහම ආතතිය නිකංම හොඳවෙනව...

## කලින් පැමිණීම

**අම්මා** - පුතාට මල්ලිල දෙන්නෙක් ලැබුණු බව කිව්වහම අද කලින් ඉස්කෝලෙන් එන්ඩ දුන්න නේද?

**පුතා** - ඔව්...

**අම්මා** - පුතා ටීචර් මොනවද කිව්වෙ?

**පුතා** - මම කිව්ව අම්මට පුතෙක් ලැබුණා කියල...

**අම්මා** -එතකොට අනිත් මල්ලි ගැන කිව්වෙ නැද්ද?

**පුතා** - ලබන සතියෙ අනිත් මල්ලි ලැබුණා කියල නිවාඩුවක් ඉල්ල ගන්ඩ පුලුවන්... ඒ නිසා අනිත් මල්ලි ගැන කිව්වෙ නෑ...

# මුඛ පිළිකාව ඔබ සොයා පැමිණිය හැකිය. අවධානයෙන් සිටින්න...



**පිළිකාව කියූ සැණින් අපගේ සිතට නැගුණේ මරණ බියකි. එහෙත් ඒ එදාය. නමුත් පිළිකාව කලින් හඳුනා ගන්නේ නම්, එය සුවකළ හැකි රෝගයක් වන බව අපි මේ වන විට දන්නෙමු.**

පිළිකාවන් ගැන කතා කිරීමේදි කාන්තාවන්ට හා පිරිමින්ට ආවේණික වූ පිළිකා පවතී. කාන්තාවක් වීම නිසා වැඩි වශයෙන් වැළඳෙන පිළිකාවන්ද, පිරිමින් වීම නිසා වැඩි වශයෙන් වැළඳෙන පිළිකාවන් ද වශයෙන් වෙන්කර සාකච්ඡා කළ හැකිය. මේ අනුව පිරිමින් අතර, බහුලවම දක්නට ලැබෙන පිළිකා රෝගයක් ලෙස මුඛ පිළිකාව හඳුන්වා දිය හැකිය. වර්තමානය වන විට මුඛ පිළිකාවට ගොදුරු වන පිරිස ක්‍රම ක්‍රමයෙන් වැඩී වී ඇත. වසරකට මුඛ පිළිකා රෝගීන් 2000 ක් පමණ හඳුනා ගන්නා අතර ඉන් 1000 ක් පමණ මිය යන්නේය. එහෙත් මුඛ පිළිකාවේ පූර්ණ ලක්ෂණ පෙන්වන විට එයට ප්‍රතිකාර කර නිට්ටාවට සුවකර ගත හැකිය.

මුඛ පිළිකාව වැළඳීමේ අවදානම් සාධකවලින් ඔබට මිදී සිටිය හැකි නම් මුඛ පිළිකාව ඔබ සොයා නොඑනු ඇත.

## අවදානම් සාධක යනු මොනවාද?

1. බුලත්විට සැපීම.
2. පුවක්, පුවක් පැකට් හා පුවක් ආශ්‍රිත නිෂ්පාදන සැපීම.
3 දුම්පානය කිරීම.

ඔබ බුලත් විට යහමින් සපනවා නම්, එසේම බාබුල්, වැනි පුවක් ආශ්‍රිත නිෂ්පාදන නිතර නිතර ආහාරයට ගන්නේ නම්, ඔබ මුඛ පිළිකාවට ගොදුරු වීමේ වැඩි අවධානමක් පවතී. බුලත්විටේ අඩංගු පුවක්, හුණු, දුම්කොළ තුන්වර්ගයම පිළිකා කාරකය.

පුවක් ගෙඩියේ අඩංගු ඇරිකඩින්, ගුවායින් හා ගුවාකෝලින් යන ඇල්කොලයිඩ් වර්ග මුඛය තුළදී සිදුවන නයිට්‍රේෂන් ක්‍රියාවලියේදී "නයිට්‍රොසොඇමින්" නම් පිළිකා කාරකය නිෂ්පාදනය කරයි.

දුම්කොළ මගින් නිකුත් වන පිළිකා ජනක විසිඅටකි. දුම්කොළ සැපීමේදී මුඛ ශලේෂ්මලයේ සෛල තුළ ඔක්සිජන් අණුක පරමාණුවක් නිකුත් වීම මගින් ජාන විකෘතිතාවක් සිදුවන බව සොයාගෙන ඇත.

හුනු, සෛලවලට විෂවන අතර, එමගින් මුඛ ශලේෂ්මලය තුවාල කරයි. එම තුවාල මගින් සෙසු පිළිකා කාරක සිරුරට උරා ගැනීම පහසු කරයි. එමෙන්ම හුනු සහ පුවක් සංයෝග වීමෙන් මුඛ ස්ලේශ්මලයේ සිදුවන රසායනික ක්‍රියාවක් හේතුවෙන් ජාන විකෘතිතා ඇති කරවයි. කල්ගතවීමේදී පිළිකා තත්වයන් මතුවේ.

බුලත් කොළයේ මුල සහ අග, මල් අඩංගු "සැන්රෝල්" නමැති සංයෝගය පිළිකා කාරකය.



එසේම දුම්කොළවල පිළිකා කාරක 70 ක් අඩංගුව පවතින බැවින් දුම්කොළ භාවිතය මුඛ පිළිකාවට අමතරව වකුගඩු ගලනාල, ආමාශ හා මූත්‍රාශ පිළිකා ඇති කිරීමටද හේතුවක් වන්නේය.

කෙසේ නමුත් පුවක් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන දිනපතා සැපීම හේතුවෙන් පිළිකාවට වඩා දරුණු රෝගයක් වන



"මුඛ ශ්ලේෂ්මල ෆයිබ්‍රෝසියාව" ට ඉක්මනින්ම ගොදුරු වේ.

## මුඛ ශ්ලේෂ්මල ෆයිබ්‍රෝසියා රෝගයේ ලක්‍ෂණ

- ආහාර ගන්නා විට මුඛයේ අධික දැවිල්ලක් ඇතිවීම.
- මුඛ සහ තොල් ස්ලේෂ්මලය සුදුමැලි වීම.
- ඇල්លූ විට රබර් වැනි ගතියක් දැනීම.
- මුඛය විවෘත කිරීමට නොහැකිවීම.
- කථා කිරීමට නොහැකි වීම.

මෙසේ ෆයිබ්‍රෝසියාවට ගොදුරුවන පුද්ගලයින් ඉතාමත් ඉක්මනින් මුඛ පිළිකාවට ගොදුරු වේ. පිළිකාවට ගොදුරු වීමට පෙර පූර්ණ පිළිකා ලක්‍ෂණ මතුවේ.



"ඔබ දිනකට බුලත් විට තුනක් හෝ ඊට වඩා සපන්නෙක්ද, දුම්පානය හා මත්පැන් පානය කරන්නෙක්ද, පුවක් ආශ්‍රිත නිෂ්පාදනයන් භාවිතා කරන්නෙක්ද?"

## පූර්ව පිළිකා ලක්‍ෂණ මොනවාද?

- මුඛයේ පවතින සුදු ලප.
- ඉවත් කළ නොහැකි රතු ලප.
- ඉවත් කළ නොහැකි රතු සහ සුදු මිශ්‍ර ලප.
- මුඛයේ අසාමාන්‍ය දැවිල්ලක් සමග තොල් සහ ශ්ලේෂ්මලයේ ඝනවීමක්, රළුවීමක්.
- මුඛයේ කාලයක් පවතින සුව නොවන තුවාලයක්.



එසේනම් ඔබට මුඛ පිළිකාව වැළඳීමේ අවදානමක් පවතී.
සෞඛ්‍යයට හානිදායක ඉහත සඳහන් පුරුදුවලට ඔබ නිරත වන්නේ නම්, මසකට වරක් හෝ ස්වයං මුඛ පරීක්‍ෂාවක් සිදුකර ගතයුතු අතර, පූර්ව පිළිකා ලක්‍ෂණ එකක් හෝ පවතින්නේ නම් වහාම දන්ත වෛද්‍යවරයෙකු වෙත ගොස් පරීක්‍ෂා කර ගැනීමෙන් මුඛ පිළිකාවෙන් මිදී සිටීමට ඔබට හැකි වෙනු ඇත.

මහරගම දන්තායතනයේ
දන්ත වෛද්‍ය විශේෂඥ
හේමන්ත අමරසිංහ
(Health & Life මාසික සඟරාව ඇසුරිනි)





# සංචාරයක සටහන්...

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ඉකුත් දෙසැම්බර් 04 දින 7 ශ්‍රීලයුකාබ ඒකකයේ සංචාරයක නිරත විය. එහිදී ඒකකයේ රාජකාරී ස්වභාවය හා පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි භට පිරිස් ඇමතීමටද කටයුතු කරන ලදී.







# නව ව්‍යාපෘතියකට අඩිතාලමක්...





යුද්ධ හමුදාව හා පොල් පර්යේෂණ ආයතනයේ සම්බන්ධතාවයෙන් යුතුව නවමු පොල් ප්‍රභේද වගාකිරීම සම්බන්ධ ක්ෂේත්‍ර නියමු ව්‍යාපෘතියක් යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් 28 දින අරඹන ලදී. මේ යටතේ යාපනය

ආරක්ෂක සේනා මූලස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන ගොවිපලෙහි අක්කර 06 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි පොල් පැළ 358 ක් රෝපණය කිරීම සිදුවිය. මෙම අවස්ථාවට පොල් පර්යේෂණ මණ්ඩලයේ නිලධාරීන් සමග හමුදා සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගී වූහ.

# ආඥාපති කඳවුරු සංචාරයක...





වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී ඉකුත් නොවැම්බර් 29 දින 16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කඳවුරු සංචාරයක නිරත විය. එහිදී එම සංචාරයට සමගාමීව කඳවුරු භූමියේ ස්ථාපිත ජල පිරිපහදු යන්ත්‍රාගාරය විවෘත කිරීමද ආඥාපතිගේ සුරතින් සිදුකෙරිණ. එම අවස්ථාවට 56 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්ජේආර්කේ සේනාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් හා සෙබළ පිරිසක්ද එක්වූහ.

---

# ඉගෙනුමට අත්වැලක්...

වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ 211 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් එල්පීකේසී විජේතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්‍ෂණයෙන් එම බළප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන දූවා දරුවන් 200 ක් සඳහා පාසල් පොත් බෙදාදීමේ උත්සවයක් ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) ශ්‍රවණාගාරයේදී ඉකුත් දෙසැම්බර් 14 දින පවත්වන ලදී.



මෙම මහගු සත්කාරය සඳහා මහජන බැංකු බෞද්ධ සංගමය පූර්ණ දායකත්වය ලබාදෙන ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති එක්වූ අතර, මහජන බැංකුවේ බෞද්ධ සංගමයේ සභාපති ජ්‍යෙෂ්ඨ කළමණාකරු රොහාන් පෙරේරා මහතා ඇතුළු එම සංගමයේ නියෝජිතයින්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයින්, පාසල් දරුවන් සහ ඔවුන්ගේ දෙමාපියන් මෙන්ම ගුරුවරු පිරිසක් ද සහභාගි වූහ.



# "නත්තල් දේවදූත සන්ධ්‍යාව - 2019"...







ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) විසින් පවත්වනු ලැබූ "නත්තල් දේවදූත සන්ධ්‍යාව - 2019" වාර්ෂික නත්තල් ගී කැරොල් ප්‍රසංගය ඉකුත් දෙසැම්බර් 19 දින මඩකලපුව ගාන්ධි උද්‍යානයේදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු ආචාර්යය ජෝශප් පොන්නයියා සහ ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී සහභාගි වූහ. මෙම අවස්ථාවට ශාන්ත මෙතෝදිස්ත පල්ලියේ ගායන කණ්ඩායම, අක්කරෙයිපත්තු පැරිස් පල්ලිය, නවාක්කුඩා පැරිස් පල්ලිය, අම්පාර පැරිස් පල්ලිය, මඩකලපුව ඇමෙරිකානු මිෂනාරි පල්ලිය සහ ශාන්ත මයිකල් විද්‍යාලයේ ළමුන් හා යුද්ධ හමුදා ගායනා කණ්ඩායම එක්ව ගීත ගායනා කරන ලදී. "නත්තල් දේවදූත සන්ධ්‍යාව - 2019" සඳහා බෞද්ධ, හින්දු ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගමික නායකයින්, සේනාංකාධිපතිවරු, නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් වැසියන් විශාල පිරිසක් සහභාගි වූහ.

# කොස් පැළ රෝපණය කිරීමේ දැවැන්ත ව්‍යාපෘතියක්...







නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී ගේ මූලිකත්වයෙන් එම පලාතේ ජීවත්වන සිවිල් වැසියන් හා යුද්ධ හමුදා සාමාජිකයින් අතර, කොස් පැළ බෙදාදීමේ දැවැන්ත ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවන ලදී. නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානය මගින් ක්‍රියාත්මක කරනු ලබන "තුරු සිරස" දැවැන්ත වන ව්‍යාපෘතිය යටතේ වූ මෙම වැඩසටහන මගින් කොස් පැළ 40,000 ක් බෙදාහැරීමට පියවර ගෙන තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ පළමු පැළ 500 ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් විසින් ඉකුත් නොවැම්බර් 29 දින අරලගංවිල විද්‍යාල පරිශ්‍රයේදී රෝපණය කරන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් 100 කට අධික පිරිසක් සහභාගි වූහ.

# අසිරිමත් නත්තල සමරා...





උදාවූ නත්තල් සමය වෙනුවෙන් මහජනතාව අතර ආගමික සංහිඳියාව සහ සාමය ප්‍රවර්ධනය කිරීම උදෙසා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් නත්තල් බැති ගී ප්‍රසංගයක් කිළිනොච්චිය නෙළුම් පියස ශ්‍රවණාගාරයේදී ඉකුත් දෙසැම්බර් 13 දින පැවැත්විණ. නත්තල් බැති ගී සැඳැව කිතුණු ආගමික නායකයින් සහ හින්දු ආගමික නායකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ අතර, එම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කිළිනොච්චිය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩියූ අයිජී සහභාගි විය. මෙම අවස්ථාව සඳහා කිතුණු නායකයින්, 57, 66 සේනාංකයන්හි සේනාංකාධිපතිවරු සහ බළසේනාධිපතිවරු, නිලධාරීන් ඇතුලු සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.

---

# ජන දිවියට විරු සත්කාරයක්...



කිළිනොච්චි ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල සිවිල් වැසියන්ට සහන සැලසීමේ දැවැන්ත පරිත්‍යාග වැඩසටහනක් 57 වන සේනාංකයේ හමුදා සාමාජිකයින් විසින් ඉකුත් නොවැම්බර් 28 දින සංවිධානය කරන ලදී. එම ව්‍යාපෘතිය යටතේ කිළිනොච්චි ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් 20 කට සූර්ය බලශක්ති පද්ධති පරිත්‍යාග කළ අතර, සිසුන් 100 දෙනෙකුට ක්‍රීඩා භාණ්ඩ හා පාසල් උපාංග ප්‍රදානය කරන ලදී. තවද ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානය විසින් කරන ලද ඉල්ලීමකට අනුව දහම් පහන සංවිධානය අනුග්‍රාහකත්වය දක්වන ලදී.

මෙම අවස්ථාවට කිළිනොච්චිය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩියූ අයිජී, කතෝලික පූජකවරුන්, 57 සේනාංකයේ සේනාංකාධිපති, බළසේනාධිපතිවරු, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයින් මෙන්ම ප්‍රදේශවාසීන් පිරිසක් ද සහභාගි වූහ.

# විජයබාහු අන්තර් රෙජිමේන්තු සරඹ තරඟාවලිය 2019





2019 වර්ෂයේ විජයබාහු අන්තර් රෙජිමේන්තු සරඹ තරඟාවලිය ඉකුත් දෙසැම්බර් 04 සිට 06 දින දක්වා එම රෙජිමේන්තු සරඹ පිටියේදී පැවැත්විණ. විජයබාහු පාබල රෙජිමේන්තු නිත්‍ය සහ ස්වේච්ඡා ඒකක 14 ක සහභාගීත්වයෙන් පැවති එම තරඟාවලියේදී සියලු ඒකක අභිබවමින් 20(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තු සරඹ කණ්ඩායම දක්ෂතම අණදෙන්නාට හිමි කුසලානය සමගින් හොඳම සරඹ කණ්ඩායම ලෙස එහි ප්‍රථම ස්ථානය හිමිකර ගත්හ.

# බාලදක්ෂ පුහුණු සැසියක්...






ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ වාර්ෂික පුහුණු සම්මන්ත්‍රණය සහ සුහද හමුව ඉකුත් දෙසැම්බර් 13 සිට 15 දක්වා මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථානයේදී පැවැත්විණ. දිවයින පුරා විසිර සිටින බාලදක්ෂයින් 250 ක් මෙම කඳවුරට සහභාගි වූහ. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගි වූ අතර, එහිදි බාලදක්ෂයින් 154 දෙනෙකු හට ලී පදක්කම් ප්‍රදානය කරනු ලැබීය. එහිදි රුක් රෝපණ වැඩසටහනක් ද එදින පැවැත්වූ අතර, ඔවුන් මුලතිව් ප්‍රදේශයේ සංචාරයකද නිතර වූහ.

# නිලධාරී පුහුණුවීම් දින...





ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සංකල්පයකට අනුව නිලධාරී පුහුණු දිනය වෙනුවෙන් මාසිකව පවත්වනු ලබන සාමූහික ඉදිරිපත් කිරීම ඉකුත් දෙසැම්බර් මස 04 දින 64 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් හා මගපෙන්වීම මත 14 දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 64 සේනාංක දේශන ශාලාවේදී පවත්වන ලදී. ඒ අනුව එම අවස්ථාවට ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මෙන්ම එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ වන සේනාංක, බළසේනා, ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) සහ ඒකක වෙතින් ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ නිලධාරීන් 80 කට ආසන්න පිරිසක් සහභාගි වූහ.

# එකොළොස් වසක අභිමන් සැමරුම





ඉකුත් දෙසැම්බර් මස 04 දිනට යෙදුණු 21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 11 වන සංවත්සරය ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සමරන ලදී. එහිදී අණදෙන නිලධාරී වෙත කඳවුරු මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීම, ඒකකයේ රාජකාරී කරමින් සිටියදී ක්‍රියාන්විත හේතුන් මත මියගිය රණවිරුවන් සිහිකිරීම, දැනට ඒකකයේ රාජකාරී කරනු ලබන සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් හා ඔවුන්ගේ පවුල්වල ඥාතීන්ට සෙත් පැතීම වෙනුවෙන් පැවති ආගමික වතාවත් සංවත්සර දින උත්සව කටයුතු අතර ප්‍රධාන තැනක් ගන්නා ලදී.

# විකුමන් පෑ විරුවන් වෙත බුහුමන් පිදු දිනක්









සපුගස්කන්ද, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 'පීඑස්සී' පාඨමාලා අංක 13 හදාරා විසිරයන නිලධාරීන්ගේ උපාධි ප්‍රධානෝත්සවය ඉකුත් දෙසැම්බර් 13 දින ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් නෙලුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී පැවැත්විණි. එහිදී යුද්ධ හමුදා නිලධාරීන් 76 ක්, නාවික හමුදා නිලධාරීන් 33 ක්, ගුවන් හමුදා නිලධාරීන් 30 ක් හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන් 18 දෙනෙකු ඇතුලුව නිලධාරීන් 157 දෙනෙකු උපාධි හිමිකර ගත්හ. එම අභිමානවත් උත්සවයට ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක, රාජ්‍ය තාන්ත්‍රිකයින් සහ උපාධිධාරීන්ගේ ඥාතීන් ඇතුලු විශාල පිරිසක් සහභාගි වූහ.

වර්ෂ 2019 ජනවාරි 03 දින ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පුහුණු පාඨමාලා අංක - 13 ආරම්භ වූ අතර, එය වසරක පමණ කාලයක් ආවරණය කරමින් පැවැත්විණි. මෙම පාඨමාලාව තෝරාගත් ශිෂ්‍ය නිලධාරීන්ගේ වෘත්තීය දැනුම හා අණදීම යන දෙඅංශයෙන්ම වර්ධනය කිරීමේ අරමුණින් පවත්වනු ලබන අතර එවැනි පුහුණුවක් සඳහා ලෝකයේ බොහෝ සන්නද්ධ හමුදා විසින් අනුගමනය කරනු ලබන සියලුම හමුදාමය මූලධර්ම හා උපායමාර්ගික සැලසුම් ඉගැන්වීම මෙහිදී එකම වහලක් යටින් සිදුකරනු ලබයි.



# එතෙර කෙළිබිම දිනූ විරු තරුවලට උපහාර පිදේ...

පසුගියදා නිමාවට පත් වූ දකුණු ආසියානු මළල ක්‍රීඩා තරඟාවලියෙහි පදක්කම් දිනාගත් යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉකුත් දෙසැම්බර් 13 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ විශේෂ ඇගයුමට පාත්‍ර විය. එහිදී එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් යුද්ධ හමුදා මූලස්ථානය වෙත වර්ණවත් පෙරහැරකින් කැඳවාගෙන එමින් ඔවුන්ට ඉහළම ගෞරවය පුද කෙරිණ.



නේපාලයේ කත්මණ්ඩු නුවර දෙසැම්බර් මස 01 සිට 10 වන දින දක්වා පැවති දකුණු ආසියානු මළල ක්‍රීඩා තරඟාවලියේ තෙවන ස්ථානය හිමිකර ගැනීමට ශ්‍රී ලංකාව සමත් වූ අතර, එහිදී දිනාගත් රන් පදක්කම් 40 න් 19 ක් යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සතුකරගැනීම විශේෂත්වයකි. තවද, එහිදී හිමිකරගත් රිදී පදක්කම් 83 න් 29 ක්ද, ලෝකඩ පදක්කම් 128 න් 37 ක්ද දිනාගනු ලැබුවේද යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසිනි.



මෙම තරඟාවලියේදී මළල ක්‍රීඩා, කරාටේ, බර ඉසිලීම, පිහිණුම්, ටයිකොන්ඩෝ, වුෂු, මේස පන්දු, පාපැදි, වොලිබෝල්, බැඩ්මින්ටන්, අත්පන්දු, දුනු විදීම, වෙඩි තැබීම, මල්ලවපොර, ජූඩෝ, ක්‍රිකට්, බීච් වොලිබෝල්, පැසිපන්දු, බොක්සිං සහ කබඩි යන තරඟ ඉසව් නියෝජනය කළ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පදක්කම් 85 ක් දිනා ගැනීමට සමත් වූයේ යුද්ධ හමුදාවේ අභිමානය කදිමට සනාථ කරමිනි. මෙම උපහාර පිරිනැමීමේ උත්සවය සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන, දකුණු ආසියානු මළල ක්‍රීඩා කණ්ඩායමේ නායක මෙන්ම බටහිර ආරක්ෂක සේනා ආඥාපති, ක්‍රීඩා අධ්‍යක්ෂක ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක්ද එක්වූහ.





# යුද්ධ හමුදාධිපති වෙත බුහුමන් දක්වයි...

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් දෙසැම්බර් මස 06 වන දින එම ආරක්ෂක සේනා මූලස්ථානයෙහි නිල සංචාරයක නිරත විය. එහිදී සම්ප්‍රදායානුකූලව හමුදා ආචාර මධ්‍යයේ යුද්ධ හමුදාධිපතිතුමන් පිළිගැනුණු අතර, එම සංචාරයේදී යුද්ධ හමුදාධිපතිතුමා එහි භට පිරිස් ඇමතීමටද අමතක නොකළේය.







# ආපදාවන්ට ලක්වූ ස්ථාන ආඥාපතිගේ නිරීක්ෂණයට



පසුගියදා පැවති අයහපත් කාලගුණය හේතුවෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශයට අයත් ප්‍රදේශ කිහිපයක ජනතාව පීඩාවට පත්වූහ. ඔවුන් මුදවා ගැනීම හා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා යුද්ධ හමුදාව අඛණ්ඩව සිදුකරන මානුෂීය කටයුතු පිළිබඳ සොයා බැලීම පිණිස ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පසුගියදා එහි සංචාරයක නිරත විය.

VISION

# English

VISION SPECTRUM

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රිසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Somewhat

"තරමක්" යන තේරුම ඇතිව වාක්‍යයක මෙම පදය භාවිතා කිරීමේදී ධනාත්මක හා ඍනාත්මක අර්ථය ඇති අදහස් ප්‍රකාශ කිරීම සඳහා භාවිතා වීම දැකිය හැක. පහත නිදසුන් අධ්‍යයනයෙන් හුරුවන්න.

***Fomular -*** සූත්‍රය

**Subject + Be verb + Somewhat + Adjective + Object + Rest**
සබ්ජෙක්ට් + බී වර්බ් + සම්වට් + ඇජෙක්ටිව් + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + **Be** පවුලේ උපකාරක ක්‍රියා පදය + තරමක් + නාම විශේෂණ පදය + කර්මය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. She is somewhat poor.
   ෂී ඊස් සම්වට් පුවර්.
   ඇය තරමක් දුප්පත්.

2. Niroshan is somewhat rich.
   නිරෝෂන් ඊස් සම්වට් රිච්.
   නිරෝෂන් තරමක් පොහොසත්.

3. They are somewhat polite.
   දේ ආ සම්වට් පොලයිට්.
   ඔවුන් තරමක් ආචාරශීලියි.

4. This is somewhat difficult to understand.
   දිස් ඊස් සම්වට් ඩිෆිකල්ට් ටු අන්ඩස්ටෑන්ඩ්.
   මෙය තරමක් අමාරුයි තේරුම් ගන්න.

***Nota Bene*** / සැ:යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී කාල අර්ථයෙන් එම වාක්‍ය භාවිතා වී ඇති බව වටහාගත හැක. මෙම වාක්‍යය රටාව භාවිතා කිරීමේදී.• Allow :- "**ඉඩ දෙන්න**"ආදී ***Subject :-*** කර්තෘ පදය ඒක වචන හා බහුවචන කර්තෘ පද පහත පෙන්වා දී ඇති පරිදි ***Be Verb*** බී පවුලේ ක්‍රියා පද සමග භාවිතා වේ.

**Am:** වෙමි, සිටිමි යන අර්ථ ඇතිව ***I* -** මම යන කර්තෘ පදය සමග පමණක් භාවිතා වේ.

**Is:** වෙයි, සිටියි, ඉඳියි යන අර්ථ ඇතිව ඒක වචන ***(Singular - He*** ඔහු, ***She*** ඇය, ***It*** ඌ***)*** යන කර්තෘ පදය සමග පමණක් භාවිතා වේ.

**Are:** වෙනවා, සිටිනවා, ඉන්නවා යන අර්ථ ඇතිව බහු වචන ***(Plural- I*** මම, ***We*** අපි, ***You*** ඔබ, ඔබලා, ***They*** ඔවුන්***)*** යන කර්තෘ පදය සමග පමණක් භාවිතා වේ.

**Somewhat:** තරමක් ආදී වශයෙන් අර්ථ ඇතිව මෙම වාක්‍ය කණ්ඩය නිදසුනෙහි පෙන්වාදී ඇති පරිදි භාවිතා වේ.

- ***Adjective :-*** නාම විශේෂණ පද වාක්‍යයේ භාවිතා කල හැක.
- ***Object :-*** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය ඉතිරි ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.
- ***Rest :-*** ඉතිරි වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

Analysis of the sentence formation - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශනය.

Subject + Be verb + Somewhat + Ajective + Object + Rest.
සබ්ජෙක්ට් + බී වර්බ් + සම්වට් + ඇජෙක්ටිව් + ඔබ්ජෙකට් + රෙස්ට්.

කර්තෘ + බී පවුලේ උපකාරක ක්‍රියා පදය + තරමක් + නාම විශ්ලේෂණ පදය + කර්මය + ඉතිරිය.

She is somewhat poor.
ෂී ඊස් සම්වට් පුවර්.
ඇය තරමක් දුප්පත්.

***English vision*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපොදුසේබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk



# ඇලිමන්දුය ගිනිගනී

සුපුරුදු වේලාවට එදින වැඩ අවසන් වුවද වර්ෂාව හේතුවෙන් මා නිවසට යන විට වෙනදාටත් වඩා බෙහෙවින් ප්‍රමාද වී තිබිණ. කෙසේ හෝ නිවසට ඇතුල්වන විට වැස්ස තුරන් වී තිබූ අතර ගෙතුලින් මට ඇසුනේ කිහිපදෙනෙකු බොහෝ හැඟුම්බර විලාසයෙන් කතාබහ කරන අයුරුය. මා කඩිමුඩියේ සාලයට දිව ආවේ කාට හෝ කිසියම් කරදරයක් දෝයි යන සැකයෙනි. එවිට මා දුටුවේ නිවසේ පුටු සෙටියේ බිරිඳ හා දරු දෙදෙනා වාඩි වී කතාබස් කරන අයුරුය. බිරිඳ බොහෝ සෙයින් කම්පා වී ඇති සෙයකි. දියණියගේ මුහුණද මැලවී ඇත. පුතා ඉහිලුම් නොදෙන කෝපයෙන් වෙව්ලනු පෙනේ. මම කිසිවක් නොදොඩා කාමරයට වැදී ඇඳුම් මාරුකරන අතරේ ඔවුන්ගේ කතාවට කන් යොමු කළෙමි.

"අපරාදේ චේතනාට තිබුණේ ඇත්ත කියන්න." බිරිඳ ගයානි කීවාය.

"එහෙම බෑනෙ අම්මේ, ඇත්ත කීවනම් මේනක එයාට ගහනවනෙ." දුව කීවාය.

"අනේ අම්මේ මට ඕකා අහුඋනානම් මරනවා. චේතනා අක්කාට ඔය තරම් අසාධාරණ වැඩ කරනවාට." පුතා දත් මිට කමින් කීවේය.

අද මොනවා වෙයිද දන්නේ නෑ නේද අම්මේ. දුව නැවතත් හඬ අවදි කළාය.

එම කෙටි පිළිසඳර කනවැකෙත්ම එය කුමක් අරබයාද යන්න මට තේරුම් ගැනීම අපහසු නොවුණි. ජාතික වශයෙන් අද රටෙහි කොතරම් ප්‍රශ්න වෙතිද? ඒවා වැඩිහිටියන්ට පමණක් නොව දූදරුවන්ට පවා සෘජුවම බලපාන ඒවාය. ඒ ඇරුණුවිට පුද්ගලික ජීවිත තුළද එදිනෙදා නිවසේ වැඩ කටයුතුවලදීද මොනතරම් ගැටළු මතුවීද? නමුත් රූපවාහිනියට ඇබ්බැහිවූ බහුතරයක් සිදුකරනුයේ නලු නිළියන් ටෙලි නාට්‍යවල බොරුවට රඟ දක්වන සිදුවීම් ඇත්තක් සේ තම ජීවිතවලට ඈඳාගෙන වද විඳීමය. සමස්ත රටේම ජනවිඥානය රූපවාහිනී නාලිකාවල හිමිකරුවන්ගේ රුචි අරුචිකම් අනුව මෙහෙයවන තත්ත්වයට අද සෑම නිවසක්ම පාහේ පත්ව තිබේ. දේශීය මෙන්ම හඬ කවන විදේශීය මෙගා ටෙලිනාට්‍ය රැල්ලක්ද සෑම නිවසකම බහුතර කාන්තාවන් හා දරුවන්ගේ ගෙළ සිරකොට ඇති සෙයකි. එවැනි ටෙලිනාට්‍ය සුලබව දැකිය හැකි ප්‍රාථමික ගති ලක්ෂණ මැන බැලීම මෙහි අරමුණයි.

## තනි පෙළට හිඳ කතා කිරීම

බොහොමයක් මෙගා ටෙලි නාට්‍යවල එකිනෙකා කතාබස් කරනුයේ උනුන්ගේ මුහුණු බලාගෙන නොව තනිපෙළට හිටගෙන කැමරාව දෙස බලාගෙනය. දෙදෙනෙකු කතා බස් කළද සමූහයක් කතා බස් කළද එම තත්ත්වය පැහැදිළිව දැකගත හැකිය.

## උතුර දකුණ හඬකැවීම

බොහෝ හඬ කවන විදේශීය ටෙලි නාට්‍යවල දෙබස් අසන විට පාසල් ළමුන් සිදුකරන "කියවන විට ලිවීම" වැනිය. දෙබස් වලින් උතුර කියන විට කට හොල්ලන්නේ දකුණටය. කෘත්‍රිම දෙබස් එම චරිතවලට බලේට ආරූඩ කරවන බව පැහැදිළිව පෙනේ. ඒවා එතරම්ම අතාත්විකය. ඒ කෙසේ වෙතත් කෙළ ගිලින්නේවත් නැතිව ඇසිපිය ගසන්නේවත් නැතිව අකුරක් නෑර ඒවා අසා සිටින ප්‍රේක්ෂකයෝ ද අඩු නැත.

බොහෝ මෙගා ටෙලි නාට්‍යවල මුල මැද අග නොමැත. සිදුවනුයේ එදා වේල පවත්වාගෙන යාම පමණි. එවැනි ටෙලිනාට්‍යවල ඉදිරියේදී සිදුවන්නේ කුමක්දැයි අධ්‍යක්ෂකවරයාවත් නොදනී. 5 වසරේදී අරඹන ටෙලිනාට්‍ය ඇතැම් විට ඔහු හෝ ඇය අපොස සාමාන්‍ය පෙළ ලියන තෙක්ම විකාශය වේ. ඇතැම් නාට්‍ය ඒ තරම් දිගය.

සමහර ටෙලිනාට්‍ය දිගහැරෙනුයේ "යන්නේ කොහෙද මල්ලේ පොල්" ආකාරයටය. ආරම්භයේදී කිසියම් තේමාවකට කලාත්මකව ගලාගෙන යන නාට්‍ය ජනප්‍රියත්වය වැඩිවත්ම එහි ගමන් මග වෙනස් කොට කලාව පසෙක දමා වෙළඳ පරමාර්ථයට හරවයි. එහිදී කතාවේ මුල සිට සතුරෙක් ලෙස පෙන්වූ චරිතය පසුව මිතුරෙක් කරවයි. එසේ නොමැතිනම් මිතුරා සතුරා කරවයි. කිසිඳු ගැළපිල්ලක් අදාළත්වයක් නැති චරිත එක් වරම කතාව තුළට රිංගවයි. ඇඳුනුම්කමක් ඇත්නම් ඕනෑම අයෙකුට තේමාව කුමක් වුවත් එවැනි නාට්‍යවල කුමන හෝ චරිතයක් ඉල්ලා ගතහැකි වන තරමට කතාව බාල කරයි. ජනප්‍රියත්වය වැඩිවත්ම ඕනෑම කතාවක් දිගට ඇදගෙන යන්නේ ඒ අයුරිනි.

කිසියම් අයෙකු එහි රඟපෑමෙන් ඉවත් වන්නේනම් ඔහු හෝ ඇය හදිසියේ මිය ගොස් හෝ නොඑසේනම් පැවිදි දිවියට එළැඹි ලෙසින් හෝ කතාවෙන් ඉවත් කරයි. එසේම ඔවුන් නැවත රඟපෑමට එක්වන්නේ නම් මියගියවුන් අතුරුදහන් වූවන් සේ සලකා හෝ පැවිදි වූවන් සිවුරු අරවා හෝ යළි කතාවට යොදා ගනිති.

### වෙළඳ දැන්වීම්

වෙළඳ දැන්වීම් යනු විද්‍යුත් මාධ්‍ය ආයතනයක තීරණාත්මක සාධකයකි. එනිසා නාළිකා පැත්තෙන් එය බැහැර කළ නොහැක. නමුත් ප්‍රේක්ෂකයින් පැත්තෙන් එය මහා වදයකි. ටෙලි නාට්‍යයක් තුළ ඇරඹුමේදී මැදදී අගදී වශයෙන් අවස්ථා ගණනාවකදී එක දිගට වෙළඳ දැන්වීම් විකාශය වේ. ඇතැම් විට ටෙලි නාට්‍යයක් විකාශනය වන අතරතුර අතරින් පතර වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන්නේද නොඑසේනම් අඛණ්ඩව වෙළඳ දැන්වීම් පමණක් විකාශය වන වැඩසටහනක් තුළ අතරින් පතර ටෙලිනාට්‍යයක කොටස් විකාශය වන්නේද දැයි සිතාගත නොහැක.

### පාසල් නිළඇඳුමින් රඟපෑම

ඇතැම් නාට්‍යවල ප්‍රධාන චරිත සියල්ලෙහිම පාසල් ළමයින් සිටිනු පෙනේ. කතාව ආරම්භයේ සිට අවසානය තෙක්ම පෙන්වන්නේ ඔවුන් පාසල් නිළඇඳුමින් පෙම් කරන අයුරුය. නොඑසේනම් පාසල් ඇඳුමින් ගහබැනගන්නා අයුරුය. නිවසේ දර්ශනවලද පෙන්වනුයේ තම පෙම්වතාට හෝ පෙම්වතියට දුරකථන ඇමතුම් ගන්නා අයුරුය. අම්මා තාත්තාද දරුවන්ගේ එම පෙම්හබවලට අතරමැදියන් වී ඇති සෙයකි. සමස්තයක් ලෙස එම කතාවල ඇරඹුමේ සිට අවසානය දක්වාම පාසල් ළමයින් "ඉගෙන ගැනීම හැර" අන් සියලුම දේ සිදුකරන අයුරු පෙන්වයි. නිවසට වී තම දෙමාපියන් හා දරුවන් එකට සිට එම නාට්‍ය නරඹන අවස්ථාවලදී දරුවන් දෙමාපියන් දෙසත් දෙමාපියන් දරුවන් දෙසත් හොරැහින් බලන අයුරු දැකගත හැකිය.

### සිත නිවන කතා

වත්මන් ටෙලිනාට්‍යවල බහුතරයක් ඇත්තේ කුමන්ත්‍රණ, වෛරය, පළිගැනීම, විරහව පමණි. කතාව ආරම්භයේ පටන්ම පෙම්වතිය උස්සාගෙන යන්නට කට්ටියක් අර අදිති. තවත් පිරිසක් පෙම්වතාට පහර දේ. බිරිඳ සැමියා හැර ගොස්ය. නැත්නම් සැමියා බිරිඳ හැරගොස්ය. පියාගේ පාර්ශවය ධන කුවේරයෝය. නැත්නම් මව් පාර්ශවය ධනපතිනියන්ය. පිටරට සිටින පුතාට හෝ දුවට ලංකාවේ සිටින දෙමාපියෝ මඟුල් තීන්දුකර අවසන්ය. නමුත් පුතාගේ හෝ දුවගේ හිත ඇත්තේ වෙන කෙනෙකුටය. මෙය සුලබව ටෙලිනාට්‍යවල දැකිය හැකි තත්ත්වයකි. පොළොවේ පය ගසා යන ගැමි සුන්දරත්වය පිරි සාමාන්‍ය ජන ජීවිතය අළලා දිගහැරෙන ටෙලිනාට්‍ය ඇත්තේ කලාතුරකිනි.

වර්තමානයේ ඇති බොහෝ මෙගා නාට්‍යවල ඇත්තේ දේපළ බෙදාගැනීම පිළිබඳ ගැටළුය. ව්‍යාපාරයක කොටස්වල අයිතිය වෙනුවෙන් එකිනෙකා ඇනකොටා ගනිමින් කුමන්ත්‍රණ කිරීම වර්තමානයේ ජනප්‍රියයයි කියන බොහෝ ටෙලිනාට්‍යවල දැකිය හැකිය. බොහෝ දෙනෙකු මුලදී දුප්පත් අහිංසක පුද්ගලයෝය. පසුව එක්වරම ඔවුන් ෆැක්ටරි හිමිකරුවන් වෙති. සමාගම්වල අධ්‍යක්ෂවරුන් වෙති. වර්තමානයේ නාලිකා කිහිපයක විකාශනව වන ටෙලිනාට්‍ය රැසක එය පැහැදිළිව දැකගත හැකිය. ඔවුන් ගමන් කරනුයේ ප්‍රාඩෝ, ඉන්ටර්කූලර් වලිනි. බිස්නස්වල ආයෝජනය කරනුයේ මිලියන ගණන් වලිනි. ඔවුන්ගේ කාර්යාල හා නිවාස සුරවිමන්ය. මාලිගාය. ඒවා දෙස අහිංසක දුප්පත් ප්‍රේක්ෂකයින් බලා සිටිනුයේ කටවල් ඇරගෙනය. ඔවුන්ට එය සැබෑවක් ලෙසට හැඟීයයි. එවන් තනතුරු දරන්නට එවැනි වහනවල යන්නට, එවැනි නිවාසවල කාර්යාලවල රැඳෙන්නට ඔවුන් හීන දකිති.

නමුත් සත්‍ය නම් එවැනි සුපිරි පැලැන්තියේ රඟපෑම්වල යෙදෙන නලු නිලියන්ගේ සැබෑ ජීවිත ප්‍රේක්ෂකයින්ටත් වඩා අසරණය. ඔවුන් වැඩි පිරිසක් යන්නේ බස්රථවල හෝ යතුරු පැදිවලය. නොඑසේනම් ණය බරින් මිරිකී සමාජ ආර්ථික ප්‍රශ්න හමුවේ හෙම්බත්වූවන්ය.

එක්තරා දිනක මා ප්‍රිය බිරිඳ රාත්‍රී 10 වන විටත් රූපවාහිනිය අසල රැඳෙමින් එහි ඇති නාට්‍යයන් නරඹමින් සිටියාය.

"ඇයි ඔයා අද නිදාගන්නෙ නැද්ද? හෙට උදේම පුතාලගෙ ඉස්කෝලෙටත් යන්න තියෙනව කිව්ව නේද? අනික මේ රෑට ඕව බලන්න ඕනෙද?" වැරදීමකින් මා අතින් කියවිණ.

"උදේ ඉඳන් කළේ උයන එකමයි. රෙදි කප්පරක් හේදුවා. ඔයාගෙයි ළමයිගෙයි ඇඳුම් මැද්දා. ගෙවල් දොරවල් අස්පස් කළා. සේරම කරල නැහිල නැහිල පොඩ්ඩක් සැහැල්ලුවෙන් ටීවී එක බලන්න ගත්තහම ඔයා ඒකටත් නෝක්කාඩු කියනවා." ඇය මහා දෝස්මුරයක් නැගුවාය. මම නිහඬව එය අනුමත කරමින් ඇය බලන ටෙලිනාට්‍ය දෙස මොහොතක් බලා සිටියෙමි. එහි ඇත්තේ එකම කාලගෝට්ටියකි. බිරිඳ හා සැමියෙකු අතර මහා පටලැවිල්ලකි. ඒ අතර ප්‍රේමයෙන් පරාජය වූ දියණියකගේ ඉකිගැසීමකි. එය බලා සිටි විනාඩි කිහිපය තුළ මගේ ඔලුවද කරකැවෙන්නට විය. බිරිඳ කියූ පරිදි දවස තිස්සේ ගෙදර බැල මෙහෙවර කර අවසානයේ නින්දට යන මොහොතේ සැහැල්ලුවෙන් හිඳ බලන්නේ එවැනි ටෙලිනාට්‍ය නම් ඇය කෙසේ නිදාගන්නේ දැයි මට සිතා ගැනීමට නොහැකි විය.

"ඕක පොඩ්ඩක් අඩු කරන්න. අහල පහළ මිනිස්සු හිතාවි අපි දෙන්න රණ්ඩු වෙනව කියලා". මම ඇය හමුවේ බැගෑපත් වී යාන්තම් රූපවාහිනිය අඩුකර නින්දට ගියේය.

### අතපසුවන කොටස් නැවත නැරඹීම

මීට කලකට ඉහතදී එක් ටෙලිනාට්‍යයක් රූපවාහිනියේ විකාශනය කෙරුණේ සතියකට වරකි. නමුත් සතියකදී එක් වරක් ප්‍රචාරය කෙරෙන එම ටෙලිනාට්‍යයක් ගැන වුවද සතිය පුරාම කතා කරන්නට යමක් ඉතිරි වේ. නමුත් වර්තමානයේ ටෙලි නාට්‍ය කලාව ඊට හාත්පසින්ම වෙනස්ය. යමෙකුට අතපසු වුනු කොටස් පිළිබඳව එය නැරඹූ වෙන කෙනෙකුගෙන් අසා දැනගන්නට දෙයක් එහි ඉතිරි නොවේ.

"දුව මට ඊයේ "හඳ පලුව" ඩ්‍රාමා එක බලන්න බැරිවුනානේ මොකද වුනේ ඊයේ"

"ආ.... ඊයෙ ඉසුරුගේ ගෙදරට ආවනෙ කට්ටියම වෙඩින් එක ගැන අහන්න."

"ඉතිං ඊට පස්සේ"

"ඉතිං ඒ ගොල්ලෝ තේ බිබී ඒ ගැන කතා කළා"

"පස්සේ මොකද උනේ"

"කට්ටිය තේ බිබී එක එක්කෙනාගේ අදහස් කිව්වා"

"කල්පනීලගෙ ගෙදර දේවල් පෙන්නුවේ නැද්ද?"

"ඒව පෙන්නුවේ නෑ. කට්ටය කතා කරන එක තමයි පෙන්නුවේ"

"ඊට පස්සෙ මොකද"

"ඊට පස්සෙ ඉතිං වෙළඳ දැන්වීම් පෙන්නුව. ආයිත් කට්ටිය කතා කර කර ඉන්නව පෙන්නුව"

"මේ මොන විකාරයක්ද? මුලු කතාවේම තිබුනෙ එච්චරද"

"ඔව්. එච්චරයි ඉතිං. මම මොනව කරන්නද අම්මේ. ඊයෙ කොටස එච්චරයි"

දිනපතා පෙන්වන බහුතරයක් මෙගා ටෙලිනාට්‍යවල තත්ත්වය ඉහත අයුරුය. කොටසක් හෝ දෙකක් මඟහැරීම එහි රසයට හෝ තේරුම් ගැනීමට බාධාවක් නොවේ. කෙසේ හෝ එදා දවසේ ජාම

බේරා ගැනීමට ඒවයේ අධ්‍යක්ෂකවරු දක්ෂය.

සතියේ දිනවල කොටස් වශයෙන් ප්‍රචාරය වන ටෙලිනාට්‍ය සතිඅන්තයේ එක දිගට නැරඹීමේ පහසුකම්ද දැන් දැන් ප්‍රේක්ෂකයන්ට උදාවී ඇත. ඒ අනුව මගහැරුණු සහ අතපසුවුණු පසුගිය කොටස් හත අටක්ම එක දිගට බලාගත හැකිය. ඒ අනුව දහවල් පටන් සවස ඇඳිරි වැටෙන තෙක්ම ඇතැම් විට පැය හතරක් පහක් පුරාම ඒවා විකාශනය කෙරේ. මේවාට ඇබ්බැහි වී ඇති අයවලුන් මුලු සතිඅන්තයේම සියලු වැඩ පසෙකලා රූපවාහිනිය අසළ ගෙවා දමන අයුරු දැකගත හැකිය.

## දේවතාවන් බඳු නළු නිළියන්

බොහෝ හඬ කවන ඉන්දීය ටෙලිනාට්‍යවල නළු නිළියන් පෙනුමෙන් දේව රූප මෙනි. තොල් සායම් ක්‍රීම් උලා ඔවුන් රෝස පැහැගන්වා ඇත. ඔවුන් එක දිගට පැය දෙක තුනක් දුවපැන නැටුවද දහඩිය කඳුලක් නැත. කොණ්ඩය අවුල් වන්නේද නැත. තොල් සායම්ද මැකී නොයයි. මේවා බලා සිටින අපගේ ඇතැම් යුවතියන්ද තමන්ටද එසේ වියහැකි යැයි සිතා ඒ අයුරින්ම මේකප් දමාගෙන එළිමහනේ ඇවිද යද්දී විනාඩි දෙක තුනක් යන්නටත් මත්තෙන් ඉහිං කනින් දහඩිය පෙරා ගන්නා අයුරු දැකගත හැකිය.

## නව පරපුරේ ගීත ගායනා

මියුසික් වීඩියෝ අද රූපවාහිනී නාලිකා අතර බොහෝ විට ජනප්‍රිය අංගයකි. දිනපතා නවක ගායක ගායිකාවන්ගේ ගීත එමගින් අඩු නැතුවම ප්‍රචාරය කෙරේ. ඇතැම් අය තම වීඩියෝව සඳහා රුපියල් ලක්ෂ ගණනින් වියදම් කොට ඇති බැව් ඒවායේ රූප රාමුවලින් පෙනේ. එහි ඇති රූපවල ගුණාත්මකභාවයද ශබ්දවල ත්‍රීව්‍රතාවයද ඉතා ඉහළය. නමුත් අවාසනාවකට එතරම් වියදමක් දරා වුව එම ගීතවලින් ඉදිරිපත් කරනුයේ කුමක්දැයි විමසා බැලීම වටී. ඉන් සීයට අනූ පහක් පමණ ඇත්තේ විරහ ගීතය. ඒවායේ පෙම්වතා කඳුලු වගුරා හොටු පෙරාගෙන අඬනු පෙනේ. පෙම්වතිය එලෙස බලා සිටිනුයේ වගේ වගක් නොමැති අයුරිනි. මේවා නරඹන ඇතැම් ප්‍රේක්ෂකයින් ළය උණු වී දෑසින් කඳුලු වගුරන අයුරු වර්තමානයේ සුලබය. තමන්ගේ දෙමව්පියන්ගේ වියෝවකදී වවුද කඳුලක් නොහෙළන ඇතැමුන් ගීයක, ටෙලිනාට්‍යයක තිබෙන දෙයක් දැක හඬා වැටෙනුයේ කෙසේදැයි සිතාගත නොහැකිය. එවන් අවස්ථාවලදී උරය පලා ලේ දෙන්නට වුවද සූදානම් වන තරමට ඔවුන් තුළ අනුකම්පාව දෝරෙ ගලායනු පෙනේ. නමුත් හිඟන්නෙක් ගෙදරට පැමිණිය විට සතපහක් දෙන්නට ඔවුන් මැලිවේ.

## තෑගි දිනාගැනීම

ඇතැම් නාලිකාවල වැඩසටහන් විකාශය කෙරෙන අතර, තිරයේ දිස්වෙන මොනවා හෝ රූපයක් පිළිබඳ ප්‍රශ්නයක් අසා ත්‍යාග පිරිනමන අවස්ථාද තිබේ. ත්‍යාග දිනාගැනීමට නම් කිසියම් කාලසීමාවක් තුළ අදාළ රූපය කොතරම් වාර ගණනක් තිරයේ දිස්වන්නේ දැයි සොයාගත යුතුය. එහිදී එම කාලසීමාව පැය දෙක තුනක් වියහැක. නොඑසේ නම් වරුවක් හෝ දවසක් වියහැක. කෙසේ හෝ තෑග්ගට ඇති ගිජුකම නිසාම රූපවාහිනය දෙස ඇසිපිය නොහෙලා බලාහිඳිමින් ගෙදර සියලු වැඩ අතපසු කරගන්නා අයද සිටී. (එසේ ත්‍යාග දිනාගත් අයෙකු නම් මෙතෙක් මට මුණගැසීද නැත).

අද වන විට ආලින්දයේ වාඩිවී රූපවාහිනිය දෙස මුව අයා බලාසිටින සියලු දෙනා මෙහෙයවීමේ නිශේධ බලය මාධ්‍ය ආයතන විසින් අත්පත් කරගන ඇත.

ඒ ඒ නාලිකා හරහා ඔවුනට වුවමනා පරිදි පෙන්වන දේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් බැලීම හැරෙන්නට ප්‍රේක්ෂකයාට කළ හැකි අන් කිසිවක් නොමැත. දවස තිස්සේ වෙහෙස මහන්සි වී බස් රථයේ හෝ දුම්රියේ තැලී පොඩිවී නොඑසේ නම් කාර්යාලයේ දසදහසකුත් එකක් ප්‍රශ්න මැද ගතකර සවස් යාමයේ රූපවාහිනිය අභියස වාඩිවෙන ඕනෑම අයෙකුට කිසියම් නිශ්චිත වැඩසටහනක් බැලීම වෙනුවෙන් තම වටිනා කාලය බොහෝ සේ කැපකළ යුතු වේ. ටෙලිනාට්‍ය, ප්‍රවෘත්ති හෝ වෙනත් කාලීන වැදගත්කමින් යුත් වැඩසටහනක් නැරබීමේදී එහි අතරමැදියන් යොදන වෙළඳ දැන්වීම්, නීවේදක නිවේදිකාවන්ගේ කිසිඳු අදාළත්වයක් නොමැති කතා, වෙනත් තමන්ට අනවශ්‍ය තොරතුරු සියල්ලද ප්‍රේක්ෂකයා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් බලාසිටිය යුතු වේ.

කෙසේ වුවද ඉහත අපහසුතා මගහරවා කාලය ඉතිරි කර ගනිමින් තමන්ට අවශ්‍ය තමන් කැමති දේ පමණක් නරඹා මාධ්‍ය ආයතනවල හෝ නාලිකාවල අවශ්‍යතාවය අනුව නැටවෙන්නේ නැති ප්‍රේක්ෂකයෙකු වීමේ මහඟු වාසනාව තාක්ෂණයේ පිහිටෙන් දැන් උදාවී ඇත. ඒ අනුව පසුගිය වැඩසටහන් නැරඹීමේ පහසුකම් සහිත රූපවාහිනී සම්බන්ධතාවයක් තම නිවසට සවිකර ගැනීම මගින් ඉහත හිසරදයෙන් බේරීමේ හැකියාව ප්‍රේක්ෂකයාට ලැබේ.

තමන්ට අවශ්‍ය වැඩසටහන ක්‍රියාත්මක වී පැය භාගයක් හෝ පැයක් ගිය පසු රූපවාහිනිය ඉදිරිපිට වාඩි වී ඉන් තමාට වඩාත්ම අවශ්‍ය තමන් කැමතිම කොටස පමණක් ඉදිරියට හෝ පිටුපසට යවා නැරඹීම තුළින් කිසිදු නාළිකාවකට තමාව හැසිරවීමට ඉඩක් නොතබා තම වටිනා කාලය ඉතිරි කර ගැනීමේ හැකියාව එමඟින් ලැබේ. අවශ්‍ය වන්නේ මඳක් ඉවසීමෙන් හිඳීම පමණී. මෙම ක්‍රමය රූපවාහිණිය හරහා විපතට පත් වී ඇති ඕනෑම අයෙකුට වඩා යෝග්‍ය බැව් මාගේ හැඟීමයි.

එක්තරා දිනෙක හවස අප නිවසට මාගේ දියණියගේ යෙහෙළියෝ පිරිසක් පැමිණියහ. ඒ අතර දෙමාපියෝ කිහිපදෙනෙකුද වූහ. ඇතමෙක් අප නිවසට පැමිණි පළමු අවස්ථාව එය විය. කලකට පසු සිදු වූ එම හමුව අප සැමගේ උද්දාමයට හේතු වී තිබූ හෙයින් ඔවුනට ඉහළින්ම ආගන්තුක සත්කාර කිරීමට දියණියද බිරිඳද උපරිමව කැපවූහ. ඔවුන්ටද අප නිවසට පැමිණීම නැවුම් අත්දැකීමක් වනු ඇති බව අපගේද විශ්වාසය විය. නමුත් සිදු වූයේ අනෙකකි. නිවසට පැමිණි වහාම එහි සිටි එක් දියණියක් මා බිරිඳ අමතා...

"අනේ ආන්ටි චුට්ටක් ටීවි එක දාලා දෙන්නකෝ... මම නොවරදවාම බලන ටෙලිනාට්‍යක් තියෙනවා මේ වෙලාවේ" ඇය කීවාය. නිවසට ගොඩ වූ සැනින් පිළිගන්නටත් පෙරම පැමිණි උන් අතර සිටි අදාළ දැරියගේ ඉල්ලීම පරිදි අප රූපවාහිනිය ක්‍රියාත්මක කළෙමු. පුදුමයකි, වැඩි වෙලාවක් යන්නටත් මත්තෙන් පැමිණි දියණියන් මෙන්ම මව්වරුන්ද කිසිදු කතා බහකින් තොරව රූපවාහිනියට යොමු වූවා මිස කලකින් දුටු තම මිතුරිය වූ මාගේ දියණිය සමඟ හෝ අප කිසිවෙකු සමඟ කතා බස් කරන්නට තරම් වගක් ඔවුනට නොවීය. ඒ තරමට ඔවුන් රූපවාහිනියට ඇබ්බැහි වී සිටිනු දක්නට විය.

ආලින්දයේ රූප පෙට්ටිය හරහා අප රටෙහි සාම්ප්‍රාදායික පවුල් පසුබිමට හා සමාජයට සිදුව ඇති අයහපත් බලපෑම තක්සේරු කළ නොහැකි තරම්ය. එකී දියුණු තාක්ෂණික මෙවලම් හරහා අත්කර ගන්නා ප්‍රතිලාභවලට වඩා සිදු කරගෙන ඇති අවාසිය කෙතරම්දැයි මැන බැලීම වටී. මෙහි වඩාත්ම කණගාටුදායක කරුණ වනුයේ මොන තරම් පණ්ඩිතකම් දෙඩුවද  මට වුව මාගේ නිවසේද උද්ගතව ඇති ඉහත තත්ත්වය පාලනය කිරීමට නොහැකි වීමයි. ඒ නිසාම රූපවාහිනිය ලොවට දායද කළ පුද්ගලයාගේ මව්පිය පාර්ශවය සිහිකොට මා ඇඳ කෙළවරෙහි වම් ඇලයට හැරී නිදා ගත්තේ රූපවාහිනිය නරඹමින් සිටින බිරිඳටද මැදියමේ හෝ එහි පැමිණ නිදාගන්නට ඉඩ ඉතිරි කරමිනි.

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

## සංවත්සර දිනය සමරමින්...





62 සේනාංකය යටතේ ඇති 621 බළසේනා මූලස්ථානය සිය 09 වන සංවත්සරය ඉකුත් දෙසැම්බර් 01 දින සමරන ලදී. එහිදී ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් පැවති වැඩසටහන් අතර බළසේනාධිපති කර්නල් ජ්පී වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, කැබිතිගොල්ලෑව රජයේ රෝහල පිරිසිදු කිරීමේ ශ්‍රමදානය සහ නිලධාරීන්ගේ මෙන්ම සෙසුනිලයින්ගේ රසාස්වාදය වෙනුවෙන් සංගීත සැඳෑවක් පැවැත්වීම සංවත්සර දින වැඩසටහන් අතර කැපී පෙණුනි.

## ජන සෙතට විරු සවිය....





පසුගිය දිනවලදී පැවති අයහපත් කාලගුණය හේතුවෙන් ඇති වූ නායයෑම් හා හදිසි අපදා තත්වයන් නිසා මහජනතාව මහත් අසීරුතාවලට පත්විය. ඉකුත් දෙසැම්බර් මස 05 වන දින පැවති අධික වැසි සහිත කාලගුණික තත්වය හේතුවෙන් බණ්ඩාරවෙල ඕබඩාඇල්ල යන ස්ථානයේ දුම්රිය මාර්ගය මතට දැවැන්ත පස් කන්දක් කඩා වැටීම හේතුවෙන් දුම්රිය ගමනා ගමන කටයුතු ඇනහිට ඇත. එහිදී මධ්‍යම ආරක්‍ෂක සේනා මූලස්ථානයේ භට පිරිස්වල මැදිහත් වීමෙන් නැවත එම දුම්රිය මාර්ගය පිළිසකර කර යථා තත්වයට පත්කරන ලදී.

## 12 වන බළඇණි සංවත්සරය සමරමින්...





17(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ඉකුත් දෙසැම්බර් මස 01 දින 12 වන බළඇණි සංවත්සරය අති උත්කර්ෂවත්ව සමරන ලදී. සංවත්සර දින වැඩසටහන් අතුරින් ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී ගේ කඳවුරු සංචාරය සහ 611 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්එම්ආර්එස්පී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ කඳවුරු සංචාරය විශේෂ තැනක් ගන්නා ලදී.



# පිරිසිදු වෙරළක්....
# සුන්දර රටක්....

අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව රට පුරා ක්‍රියාත්මක කෙරෙන පිරිසිදු රටක් ගොඩනැගීමේ ව්‍යාපෘතියට පසුගියදා රණවිරුවෝද එක්වූහ. ඒ අනුව යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් මත රටපුරා යුද හමුදා කඳවුරු ස්ථාපිත ප්‍රදේශ ආශ්‍රිතව ඇති මුහුදු වෙරළ තීර පවිත්‍ර කිරීමේ වැඩසටහනක් අරඹා ඇත. දිනාදුන් දේශය සුන්දර කිරීම පිණිස රණවිරු දෑත් එකමුතුවෙන් ක්‍රියාත්මක එම මෙහෙයුම්වල විශේෂ අවස්ථා මෙහි දැක්වේ.

## මුත්තුවල් හි කාක දූපත වෙරළ තීරය









යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම මත දිවයින පුරා වෙරළ තීරයන් ආවරණය කරමින් සිදුකරනු ලබන දැවැන්ත වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් 29 දින මෙඩෙරා, මුත්තුවල් හි කාක දූපත වෙරළ තීරයෙන් ඇරඹිණ. මෙම වැඩසටහන සඳහා යුද්ධ හමුදාධිපතිතුමන් සහ එතුමන්ගේ දියණියන් දෙදෙනා ද සහභාගී වීම විශේෂත්වයකි. යුද්ධ හමුදා භටයින් 2300 කට අධික පිරිසක් සමඟ ස්වේච්ඡා සේවකයින් හා රාජ්‍ය සේවකයින් විශාල පිරිසක් ද මෙම ප්‍රජාසත්කාරයට එක්වූහ.

මෙම අවස්ථාවට සමගාමීව බටහිර ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත 14 සහ 58 සේනාංකයන්හි භට පිරිස්වල සහභාගීත්වයෙන් කොළඹ, මීගමුව, ගාල්ල යන ප්‍රදේශ ආවරණය කරමින් මාතර සිට පුත්තලම දක්වා ප්‍රධාන වෙරළ තීර එකවර පිරිසිදු කිරීමේ ව්‍යාපෘතීන් කිහිපයක්ද දියත් කරනු ලැබීය.

## ගුරුනගර් වෙරළ තීරය





යාපනය බළ ප්‍රදේශයේ දැනට සීඝ්‍රයෙන් පැතිරයන ඩෙංගු උවදුර තුරන් කොට සුන්දර වෙරළක් බිහිකිරීම සඳහා ඉකුත් දෙසැම්බර් මස 03 වන දින ගුරුනගර් වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්විණි. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කෙරුණු එම ප්‍රජාසත්කාරයට යාපනය දිස්ත්‍රික් ලේකම්, එහි දිස්ත්‍රික් නියෝජ්‍ය දිසාපති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, යුද්ධ හමුදා සාමාජිකයින් ඇතුලු විශාල පිරිසක් සහභාගී වූහ.

## කිරිඳි ඔය මෝය, අට්ටාල කලපුව වෙරළ තීරය





දේශීය හා විදේශීය සංචාරකයන්ටත් සියලු ශ්‍රී ලංකාවාසී ජනතාවටත් සුන්දර ප්‍රියජනක රටක් කිරීමේ අරමුණින් දියත් කෙරෙන වෙරළ පවිත්‍ර කිරීමේ වැඩසටහනට සමගාමීව 12 සේනාංක මුහුදු වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපතිගේ ප්‍රධානත්වයෙන් 12 සේනාංකාධිපති, 122 බළසේනාධිපති ඇතුලු එම බළප්‍රදේශයට අයත් නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකරන ලදී.

## මුලතිව් වෙරළ තීරය






මුලතිව් ආරක්ෂක සේනා බළප්‍රදේශයට අයත් කිලෝමීටර් 15 ක පමණ වූ මුහුදු තීරය පිරිසිදු කිරීමේ වැඩසටහන එම ආරක්ෂක සේනා මූලස්ථානය, ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්), 59 සේනාංකය යටතේ පාලනය වන බළඇණි, 64 සේනාංකය හා විශේෂ බළකා කිමිදුම් පුහුණු පාසල - නයාරු හටපිරිස් සහභාගීත්වයෙන් පැවැත්වූහ. මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මෙහෙයවීමෙන් පසුගිය දෙසැම්බර් 19 දින සිදුකළ මෙම මාහැඟි ප්‍රජා සත්කාරයට නිලධාරීන් 50 දෙනෙකු හා සෙබලුන් 750 ක පිරිසක් සහභාගි වූහ.

## ත්‍රිකුණාමලය මනියාවේලි වෙරළ තීරය






221 බසේමු යටතේ ස්ථාපිත 2 (සෙව්) ගජබා රෙජිමේන්තුවට අයත් හටපිරිස් විසින් ද ත්‍රිකුණාමලය මනියාවේලි මුහුදු වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 06 දින සිදුකරන ලදී. ඊට සමගාමීව 221 බළසේනාව යටතේ ස්ථාපිත 6 වන විජයබාහු පාබල රෙජිමේන්තු හටපිරිස්ද තිරියාය ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන පරිශ්‍රයද පිරිසිදු කිරීමේ වැඩසටහනක් සඳහා එක්වූහ.

# "ආකල්ප සංවර්ධනය තුළින් යහපත් දිවියක්"....

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ "ආකල්ප වර්ධනය තුළින් අරුත්බර දිවියක්" උදෙසා වූ දේශන මාලාවක් යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂක මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරේ.
ඒ යටතේ "යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගැනීම තාරුණ්‍යය හා කාන්තා සෙබළිය, පුද්ගල සංවර්ධනය, නිරවුල් මානසිකත්වයෙන් සිය වෘත්තීයේ නියැලීම සහ ධනාත්මකව ජීවිතයකට මුහුණදීම" යන කරුණු පිළිබඳව හටපිරිස් තුළ ආකල්ප වර්ධනය කිරීම අපේක්ෂිතය.
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රාජකාරී නියුතු ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති (ජාශිබ) විසින් එම දේශනය මෙහෙයවනු ලබන අතර, අදාළ දේශන පිළිබඳ දිවයිනේ බොහෝ අංශ, ආයතන වෙතින් මේ වනවිටත් මෙම අම වෙත බොහෝ ඇගයුම් හා ඉල්ලුම්ද ලැබෙමින් පවතී.



ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) හි පැවති දේශනයේදී



අනුරාධපුර යුද්ධ හමුදා හෙද විදුහලේ පැවති දේශනයේදී



# "යුද සාහිත්‍යය" දේශනයන්...

"යුද්ධය අවසන්ව මේ වනවිට දස වසක් ඉක්ම ගොස් ඇතත් අප රට තුළ තවමත් යුද සාහිත්‍යයක් බිහිවී නොමැත. තිස් වසරක් පුරා මෙරට පැවති යුද්ධයට සක්‍රීයව දායකත්වය දැක්වූ බොහෝ දෙනෙකු ගෙවී ගිය දශකය තුළ සේවයෙන් ඉවත්ව හෝ විශ්‍රාම ගොස් ඇත. ඉදිරි කාලපරිච්ඡේදය තුළදීද තවදුරටත් එවැනි පිරිස් හමුදාවෙන් ඉවත් වීමට නියමිතය. ඒ අනුව අනාගතයේදී කිසිදු යුද අත්දැකීමක් නොමැති පිරිසක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ බිහිවනු ඇත.

ඕනෑම රටක හමුදාවක ඇති විය හැකි සාමාන්‍ය තත්ත්වය එය වුවද යුද අත්දැකීම් යනු කෙනෙකු විශ්‍රාමය සමඟ රැගෙන යායුතු දෙයක් නොවන්නේය. එය ඉදිරි රණවිරු පරපුර උදෙසා බෙදාදිය යුතු දෙයකි. අනාගත හමුදාවක අභිමානය රදා පවතිනුයේ එකී අත්දැකීම් මතින් ලබන පන්නරය තුළිනි. එබැවින් තමන් සතු යුද බිමේ මතක ලේඛන ගත කිරීමත් එකී අත්දැකීම් පිළිබඳ අලුත් රණවිරු පරපුර දැනුවත් කිරීමත් එම අත්දැකීම් සහිත සෑම තරාතිරමකම හමුදා සාමාජිකයින් සතු වගකීමකි."



මාදුරුඔය විශේෂ බළකා පුහුණු පාසලේ පැවති දේශනයේදී

ඉහත අරමුණ පෙරදැරිව යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් යුද්ධ හමුදා අංශ, ආයතන තුළ මෙන්ම පාසල් ඇතුලු සිවිල් සමාජය අතර, "යුද සාහිත්‍යය" ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් අරඹා ඇත. අදාළ දේශන පිළිබඳව බොහෝ අංශ වෙතින් මේ වනවිටත් විශාල ඉල්ලුමක් හා ඇගයුමක් ලැබෙමින් පවතී. මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ යන නිලධාරී විසින් එම දේශන මෙහෙයවන අතර, තත් නිලධාරී යුද අත්දැකීම් ඇසුරෙන් පොත්පත් රැසක් රචනා කොට ඇති එම විෂය පිළිබඳ අත්දැකීම් සපිරි අයෙකි. එසේම ඔහු "රණවිරුවා" සඟරාවේ ප්‍රධාන සංස්කාරක ලෙසද කටයුතු කරයි.



කොත්මලේ භාෂා පුහුණු පාසලේ පැවති දේශනයේදී



## සංචාරයක සටහන්....

53 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ඉකුත් දෙසැම්බර් මස 04 වන දින 8 වන ගජබා රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය. එම ඒකකයේ දෛනික රාජකාරී කටයුතු මෙන්ම ඔවුන්ගේ පාලන අවශ්‍යතා පිළිබඳ එහිදී සේනාංකාධිපතිගේ නිරීක්ෂණයට බඳුන් විය.

## ආපදාවන්ට ලක්වූවන් වෙනුවෙන් යුද්ධ හමුදාවේ සහය...



මෙම දිනවල පවතින අධික වර්ෂාපතනය හේතුවෙන් මුලතිව් මැරිටයින්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොමුලමුණේ කැළණි පාලම ප්‍රදේශයේ දැඩි ගංවතුර තත්ත්වයක් ඇතිවිය. එහිදී  593 බළසේනාව යටතේ ස්ථාපිත 19 වන ගැමුණු හේවා බළඇණියේ භට පිරිස් නාවික හමුදාවේද සහය ඇතිව එම ගංවතුරට හසුව අවතැන්ව සිටි පුද්ගලයින් 08 දෙනෙකු විශේෂ ක්‍රියාන්විතයක් මගින් බේරාගැනීමට ක්‍රියාකළහ.



## ජීවිතය දිනුමට හරවත් දේශනයක්....

යාපනය බළ ප්‍රදේශයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙනීන් හට ඒඩ්ස් රෝගය පිළිබඳව හා එය වළක්වා ගැනීම පිණිස වූ දැනුවත් කිරීමේ දේශනයක් පසුගිය දෙසැම්බර් මස 04 වන දින ආරක්ෂක සේනා මූලස්ථාන පරිශ්‍රයේදී පවත්වන ලදී. ජාත්‍යන්තර ඒඩ්ස් දිනයට සමගාමීව මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ අධීක්ෂණයෙන් යුතුව සංවිධානය කෙරුණු එම දේශනයට යාපනය මූලික රෝහලේ උපදේශක වෛද්‍ය ප්‍රියන්ත බලගල්ල මහතා ඇතුළු වෛද්‍යවරුන් හා කාර්ය මණ්ඩලය සම්පත් දායකත්වය දැක්වූහ. මෙම අවස්ථාවට  එම බළප්‍රදේශයේම රාජකාරී කරනු ලබන යුද හමුදා සාමාජිකයන් 400 කට අධික පිරිසක් සහභාගී වූහ.





## 11 වන සංවත්සර දින සමරයි...





ඉකුත් දෙසැම්බර් 10 දිනට යෙදී තිබූ 64 සේනාංකයේ 11 වන සංවත්සරය එම ඒකක මූලස්ථානයේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ. එහිදී ආගමික කටයුතුවලට මුල්තැනක් දෙමින් පැවති වැඩසටහන් අතරට පිරිත් පිංකම, හින්දු දේව මෙහෙය, කතෝලික දේව මෙහෙය සහ ඉස්ලාම් දේව මෙහෙය අයත්විය. තවද සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී වෙත සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, අන්තර් බළඇණි ක්‍රිකට් සහ වොලිබෝල් තරගාවලිය මෙන්ම සංගීත සන්ධ්‍යාවද සංවත්සර දිනය වර්ණවත් කළ සෙසු වැඩසටහන් අතර කැපී පෙනුණි.

## දස වසක අභිමන් සමරා...





66 සේනාංකයේ 10 වන සංවත්සරය ඉකුත් දෙසැම්බර් මස 10 හා 11 දිනයන්හි උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ. එහිදී සේනාංකාධිපති වෙත ගෞරවනීය සම්මාන මුරයක් පිරිනැමීමෙන් ඇරඹුණු සංවත්සර කටයුතු අතර, සියලු නිල දිවා භෝජන සංග්‍රහය හා ආගමික වතාවත්වලට ප්‍රධාන තැනක් හිමිවිය. එසේම ප්‍රදේශයේ වැඩිහිටි නිවාසයක 35 දෙනෙකු වෙනුවෙන් දිවා ආහාර වේලක් පිරිනැමීමද සංවත්සර කටයුතුවලට සමගාමීව සිදුකෙරිණ.

## 26 වසක් නොනැවතී පෙරට...





9 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 26 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් 01 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් අභිමානවත් වූ වැඩසටහන් මාලාවක් ඒකක මූලස්ථානයේදී පවත්වන ලද්දේ අණදෙන නිලධාරී ඇතුලු සියලු නිලයන්ගේ සාමූහික එකමුතුවෙනි.

සංවත්සර උත්සවයේ සමාරම්භක අවස්ථාව සනිටුහන් කරමින් අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීම, සියලු නිල තේපැන් සංග්‍රහයක් සහ දිවාභෝජන සංග්‍රහයක් පැවැත්වීම එහිදී කැපී පෙනුණි.

# සංවත්සර දින සැමරුමට අභිමානයක්...





59 වන සේනාංකයේ 12 වන සංවත්සරය සහ සේනාංකාධිපතිතුමාගේ නිල උසස්වීම නිමිත්තෙන් සංවිධානය කරන ලද වැඩසටහන් මාලාවක් ඉකුත් නොවැම්බර් 29, 30 සහ දෙසැම්බර් 01 යන දිනයන්හි එම සේනාංක මූලස්ථානයේදී පැවැත්විණ. එහිදී සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ආගමික වතාවත්වලින් ඇරඹි එම උත්සව කටයුතු අතරට මුල්ලයාවේලි පාරි ළමා නිවාසයේ නේවාසික දරුවන් හට දිවා ආහාර වේලක් පිරිනැමීම, සේනාංකාධිපති වෙනුවෙන් පැවති කඳවුරු මුරය සහ සම්මාන පෙළපාලිය, සියලු නිල තේපැන් සංග්‍රහය, රාත්‍රියේ පැවති සංගීත ප්‍රසංගය යන කටයුතු ප්‍රධාන විය. තවද නොවැම්බර් මස පුරා පැවති ක්‍රිකට්, වොලිබෝල් සහ පාපන්දු තරඟවලින් දක්ෂතා දැක්වූ අයවලුන් හට කුසලාන සහ සහතික පත් පිරිනැමීමද සේනාංකාධිපති ගේ සුරතින් සිදුකෙරිණ.

# දස වසරක අභිමන් සැමරුම



23 වන විජයබාහු පාබල රෙජිමේන්තුව සිය 10 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් 24 දින ඒකක අණදෙන නිලධාරී මේජර් ඒබීඑස් අතුකෝරල ආර්ඩබ්ලිව්පී ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එහිදී සියලු රණවිරුවන් හට සෙත්පතා බෝධිපූජා පිංකමක් පැවැත්වීම, ඒකක අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිල තේ පැන් සංග්‍රහය සහ සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සංවත්සර දින වැඩසටහන් අතර කැපී පෙනිණි.

# මානව හිමිකම් වැඩමුළුවක්...



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ පාලනය වන 14 සේනාංක මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී I (සම්බන්ධීකරණ) වශයෙන් රාජකාරී කරනු ලබන ලුතිනන් කර්නල් එම්බීබී හේරත් ආර්එස්පී ශ්‍රීලසසබ විසින් ඉකුත් දෙසැම්බර් 02 දින නිලධාරී ප්‍රවර්ධන මධ්‍යස්ථානය - බුත්තලහිදී දෙස් විදෙස් නිලධාරීන් හට මානව හිමිකම් පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.



# රෙජිමේන්තු ඉතිහාසය



## ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



රෙජිමේන්තු අධිපති
මේජර් ජෙනරල් එච් ආර් එන් ප්‍රනාන්දු
ආර්ඩබ්ලිව්පී එන්ඩීසී

දශක 3 ක් පුරා පැවති ඊළාම් යුද්ධයේ ආරම්භක අවදිය වූ 1980 දශකය තුළදී ශ්‍රී ලංකාවේ උත්සන්න වෙමින් පැවැති දෙමළ ඊළාම් කොටි සංවිධානයේ ක්‍රියාකාරකම් හේතුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට රට තුළ ආරක්ෂක කටයුතු පුළුල් කිරීමට සිදුවිය. එම කාලසීමාවේදී ප්‍රභූ ආරක්ෂක මුර රාජකාරීන් සඳහා යොදවා සිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකායට අයත් නිලධාරී 110 ක් හා සෙසුනිලයින් 3640 ඒකරාශි කොට එම රාජකාරීන් තව දුරටත් පුළුල් කිරීමේ අරමුණින් 1989 නොවැම්බර් 01 දින මුර බළඇණිය නමින් නව ඒකකයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව යටතේ ආරම්භ කරන ලදී.

පුරෝගාමී බළකායට අයත් සෙබළුන්ගෙන් සමන්විතව ආරම්භ කරන ලද එම පළමු මුර බළඇණියේ ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ යුද්ධ හමුදා පුරෝගාමී බළකායට අයත් නිලධාරියෙකු වූ මේජර් එස් වේරගම යන ජ්‍යෙෂ්ඨ නිලධාරී පත්කරනු ලැබීය. එහි ඒකක මූලස්ථානය කොළඹ - මැලේවීදියෙහි ස්ථානගත කෙරිණ. එය ඒආර්ඕ/51/89 පී/එස්ඩී/1/81/1(04) හා 1989 නොවැම්බර් මස 01 වන දින දරන යුද්ධ හමුදා නියෝගය අනුව නගා සිටුවන ලදී.

එම වකවානුව තුළ පැවැති වාතාවරණය හා පාලන අවශ්‍යතාව මත ද මායිම් ගම්මානවල කොටි ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයේ සිටින ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ද පළමු මුර බළඇණියට අමතරව පිළිවෙලින් 2,3,4 හා 5 නමින් නවතම මුර බළඇණි 04 ක් ආරම්භ කරන ලද්දේ එම ගම්මානවල ජීවත් වූ තරුණයන් වැඩි පිරිසක් ඊට බඳවාගෙන යුද්ධ හමුදා සෙබළුන් වශයෙන් මූලික පුහුණුව ලබාදීමෙන් අනතුරුවය. මෙසේ ආරම්භ වූ මුර බළඇණි 1990 නොවැම්බර් මස 01 වන දින සිට මුර බළඇණි යන නාමය ව්‍යවහාරයෙන් ඉවත් කොට ඒ සඳහා "ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව" වශයෙන් සංශෝධනය වෙමින් රෙජිමේන්තුවක් වශයෙන් කොළඹ මැලේවීදියේ ස්ථානගත කරන ලදී. අනතුරුව ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානය 1990.12.14 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය පිහිටි බත්තරමුල්ල වෙත රැගෙන යන ලදී. මෙසේ රෙජිමේන්තුවක් ලෙස ආරම්භ වූ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි ප්‍රථම රෙජිමේන්තු අධිපති ලෙස බ්‍රිගේඩියර් එස්ජීබී ද සිල්වා කේඑස්වී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 1991 නොවැම්බර් මස 12 දින සිට රාජකාරීන් ආරම්භ කරන ලදී.

මෙම රෙජිමේන්තුව ආරම්භ කරන ලද වකවානුවේදී ඊට ආවේණික නිල ලාංඡනයක් නොතිබුණු අතර රෙජිමේන්තුවට අයත් නිලධාරීන් හා සෙසුනිලයින් පළඳිනු ලැබුවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකායට අයත් නිල ලාංඡනයයි. පසුව රෙජිමේන්තුවට ආවේණික වූ නිල ලාංඡනයක් එවකට 5 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකායට අයත් ලුතිනන් කර්නල් ඩීඑස්සී ගනේගොඩ කේඑස්වී ගේ සංකල්පයක් මත නිර්මාණය කරන ලදී.

1991 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් ඒකක තවදුරටත් ව්‍යාප්ත කරමින් 6,7,8,9 සහ 10 වශයෙන් නවතම ඒකක 05 ක් ස්ථාපිත විය. බළඇණි 10 කින් සමන්විතව තිබූ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ලංකා යුද හමුදාවේ අවශ්‍යතාව මත අභිනවයෙන් තවත් බළඇණි 06 ක් 1992.05.01 දින සිට ස්ථාපිත කරන ලදි. ඒ අනුව රෙජිමේන්තුවේ බළඇණි සංඛ්‍යාව 11 සිට 16 දක්වා වැඩි විය. පළමු වන බළඇණිය හැර අනෙකුත් සියළුම බළඇණි උතුරු නැගෙනහිර තර්ජිත ගම්මාන ආශ්‍රිතව ස්ථානගතව සිටි බැවින් රෙජිමේන්තු මධ්‍යස්ථානය යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් මත පූනානි යුද්ධ හමුදා කඳවුරු පරිශ්‍රය තුළ 1993 මැයි මස 05 වන දින ස්ථාන ගත කරන ලදි. පූනානි කඳවුරේ ස්ථාපිත කර තිබූ රෙජිමේන්තු මධ්‍යස්ථානය 1994 වර්ෂයේ පෙබරවාරි මස දෙවන සතියේදී මිහින්තලය ගම්උදා සංකීර්ණය වෙත රැගෙන ගියද එම ස්ථානය රජයේ වෙනත් ව්‍යාපෘති කටයුත්තක් සඳහා යොදා ගැනීම හේතුවෙන් එය 1994 මාර්තු මස 04 වන දින දැනට ස්ථාපිත කුරුණෑගල වැහැර ප්‍රදේශයට ගෙන යන ලදී.

පැවති යුදමය වාතාවරණය හමුවේ මෙම රෙජිමේන්තුව තුළ 1996 ඔක්තෝබර් මස 29 වන දින 17, 18, 19 සහ 20 ලෙස නව බළඇණි 4ක් ස්ථාපනය කරන ලද අතර යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය මත මෙම රෙජිමේන්තුවට අයත් 7 වන බළඇණිය සහ 8 වන බළඇණිය වෙනත් රෙජිමේන්තු වෙත

අන්තර්ග්‍රහණය කළේය. ඒ අනුව 1998 මැයි මස 22 වන දින 7 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව 7 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ලෙසත්, 8 වන බළඇණිය 12 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ලෙසත්, 1998 ජූලි මස 17 වන දින මෙම රෙජිමේන්තුව වෙතින් ඉවත්කරන ලදි. එහෙත් 7 වන බළඇණිය සහ 8 වන බළඇණිය එලෙස මෙම රෙජිමේන්තුව වෙතින් ඉවත් වුවද නවක සාමාජිකයින් වශයෙන් 21 වන බළඇණිය 1998 ජූලි මස 28 වන දින ද 22 වන බළඇණිය 1998 ජූලි මස 28 වන දින ද මෙම රෙජිමේන්තුව යටතේ ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව වෙත අභිනවයෙන් පිහිටුවන ලද තනතුරක් වූ මධ්‍යස්ථාන සේනාවිධායක ධූරය සඳහා ලුතිනන් කර්නල් ඩීඑච්එම්ඩබ්ලිව්බී තම්මිට ශ්‍රීලංසීරෙ ජ්‍යෙෂ්ඨ නිලධාරී 2007 ජූලි මස 09 වන දින රාජකාරී ආරම්භ කරන ලදී.

2007 වර්ෂය උදාවත් සමගම මාවිල්ආරු සොරොව්වෙන් ආරම්භ කරන ලද වන්නි මානුෂීය මෙහෙයුම සඳහා ඇතිවූ හටපිරිස්වල අවශ්‍යතාවය මත 2007 මාර්තු මස 30 සිට තවත් බළඇණි කිහිපයක් මෙම රෙජිමේන්තුවට එකතු විය. ඒ අනුව 26, 27, 28, 29, 30, 31, 32, 33, 34, 35 හා 36 බළඇණි එලෙස ජාතික මෙහෙවර සඳහා අලුතින් එක්වූ බළඇණි වේ. එසේම 37 වන බළඇණිය 2009 නොවැම්බර් මස 17 වන දින ආරම්භ කරන ලදි.

ඒ වනවිට එතෙක් මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේ රාජකාරි ඉටු කරනු ලැබූ ලුතිනන් කර්නල් ඩීඑච්එම්ඩබ්ලිව්බී තම්මිට වෙනුවට 2009 අගෝස්තු මස 25 වන දින සිට කර්නල් ජේවී සිරිවර්ධන එම තනතුරේ රාජකාරින් භාරගත් අතර, ජාතික ආරක්‍ෂක බළමුළුවට අයත්ව සිටි ජ්‍යෙෂ්ඨතම නිලධාරියාද එම තනතුරට පත් ප්‍රථමයාද විය.

දශක තුනක් මුලුල්ලේ රට තුළ පැවති කුරිරු එල්ටීටීඊ ත්‍රස්තවාදය 2009 මැයි මස 19 වන දින සම්පූර්ණයෙන්ම අවසානයට පත්කරන මොහොත දක්වා පැවති මෙහෙයුම්වලට දායක වෙමින් විශේෂයෙන්ම ඇතැම් බළඇණි වන්නි මානුෂිය මෙහෙයුමේදී ක්‍රියාන්විත ප්‍රහාරක බළසේනාවන් වෙත අනුයුක්ත වෙමින්ද මෙම රෙජිමේන්තු හටපිරිස් සක්‍රියව, අසීමිත දායකත්වයක් ලබා දී ඇත.

2005, 2010, 2016 සහ 2018 යන වර්ෂයන්හිදී යුද්ධ හමුදා මූලස්ථානය මගින් සංවිධානය කරන ලද අන්තර් රෙජිමේන්තු සරඹ තරගාවලින්හි ශූරතා ධජය සිව් වතාවක් දිනාගෙන ඇති මෙම රෙජිමේන්තුව යුද්ධ හමුදා ඉතිහාසය තුළ විවිධ ක්‍රීඩා ඉසව් නියෝජනය කරමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ රැසකට හිමිකම් කියන ක්‍රීඩකයින් ලක්මවට දායාද කළ අභිමානවත් රෙජිමේන්තුවකි.

රෙජිමේන්තු අධිපතිවරුන් 17 දෙනෙකුගේ නොසැලෙන නායකත්වය යටතේ අභිමානවත් ගමන් මගක 29 වන කඩඉම පසුකිරීමට ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව 2019 නොවැම්බර් මස 01 දින සමත් විය. වර්තමාන රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී ද, මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස බ්‍රිගේඩියර් ඒජේ ගුණවර්ධන ආර්එස්පී ද මෙම රෙජිමේන්තුව මෙතෙක් ආ ජයග්‍රාහී ගමන් මග තවදුරටත් ඔපමට්ටම් කරමින් නිවැරදි දිශානතියකට රැගෙන යාමට පෙරගමන්කරුවන් ලෙස ක්‍රියාකරනුයේ සාමූහික හැඟීමෙන් යුතුවය.

**ඉදිරිපත් කිරීම**
**රෙජිමේන්තු මධ්‍යස්ථානය -**
**ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුව**

# සංචාරයක සටහන්...

ගැමුණු හේවා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීඑස් බන්සජයා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ඉකුත් නොවැම්බර් 30 දින වසර 54 කට උරුමකම් කියන මාතර ලන්දේසි කොටු පවුර තුළ පිහිටුවා ඇති වර්ණලාභී ඒකකයක් වන 3(සෙව්) ගැමුණු හේවා බළඇණියේ කඳවුරු සංචාරයක නිරතවිය. එහිදී එම ඒකකයේ රාජකාරී කටයුතු හා පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.









උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ උපකරණ මාස්ටර් ජෙනරාල් ලෙස

**මේජර් ජෙනරාල්**
**එම්ඒඩී සිරිනාග**

2019 දෙසැම්බර් මස 09 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ලෙස

**මේජර් ජෙනරාල්**
**සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩියු**

2019 දෙසැම්බර් මස 09 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී**

2019 දෙසැම්බර් මස 24 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



යුද සේවා ලේකම් ශාඛාවේ යුධ සේවා ලේකම් ලෙස

**මේජර් ජෙනරාල්**
**පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී**

2019 දෙසැම්බර් මස 24 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



මූල්‍ය කළමනාකරණ ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරාල් කළමනාකරණ ලෙස

**මේජර් ජෙනරාල්**
**සීකේ හඳුන්මුල්ල**


2019 දෙසැම්බර් මස 10 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



12 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ඒඑල්පීඑස් තිලකරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකායේ කර්නල් සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**ආර්එල්සී ප්‍රනාන්දු ඒඒටීඕ**

2019 දෙසැම්බර් මස 10 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ආඥාපති ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්එස් රාජකරුණා යූඑස්පී**

2019 දෙසැම්බර් මස 09 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**
**කේඩබ්ලිව්ආර් ද ආබ්‍රෙව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**
**එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු**

2019 දෙසැම්බර් මස 24 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2019 දෙසැම්බර් මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**එම්ආර් වන්නිආරච්චි ඒඕටී**

2019 දෙසැම්බර් මස 27 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**
**පීඑම්වල් චන්ද්‍රසිරි**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩීසී**

2019 නොවැම්බර් මස 14 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකායේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**අයිපී කඳනආරච්චි**

2019 නොවැම්බර් මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



592 බළසේනාවේ බළසේනාධිපති ලෙස

**කර්නල්**
**එම්ජීඒඑන්බී මහතුවක්කාර**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2019 දෙසැම්බර් මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ජ්‍යෙෂ්ඨ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස

**කර්නල්**
**එන් මහවිතාන**

2019 දෙසැම්බර් මස 24 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**කර්නල් ආර්පීඑස් පද්මශාන්ත**
**එල්එස්සී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



අභිමංසල 1 සුවසහන නිකේතනයේ සේනාවිධායක ලෙස

**කර්නල් ටීඑම් හෙට්ටිආරච්චි**
**ආර්එස්පී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) කර්නල් පාලන/භකාස ලෙස

**කර්නල්**
**ජේ රණහේවා ඒටීඕ**

2019 ජූලි මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් සැලසුම් ලෙස

**කර්නල්**
**ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ**
**යූඑස්පී පීඑස්සී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



574 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති ලෙස

**කර්නල්**
**වීඩීඑස් පෙරේරා**

2019 නොවැම්බර් මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



681 බළසේනාවේ බළසේනාධිපති ලෙස

**කර්නල්**
**ඒඑම්එස් ප්‍රේමවංශ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2019 දෙසැම්බර් මස 20 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



51 සේනාංකයේ කර්නල් ප්‍රමා ලෙස

**ලුතිතන් කර්නල්**
**ආර්ඒඑන්පී රණවීර**

2019 දෙසැම්බර් මස 19 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



58 සේනාංකයේ කර්නල් ප්‍රමා ලෙස

**ලුතිතන් කර්නල්**
**එස්අයිපී විදානගමගේ**
**ආර්එස්පී අයිජී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



# නව රගර් ක්‍රීඩාපිටියක්...



යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ අභිනවයෙන් ඉදිකරන ලද රගර් ක්‍රීඩාපිටිය ඉකුත් නොවැම්බර් 08 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් විවෘත කෙරිණ.


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**
සෙ/752158 සැරයන් සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒම් - 11 ඉසේරෙ
සෙ/2081045 ඉසෙ ලක්තිළිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**
රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**
dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076

**යුහ දිගුව**
51445/51446

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය






**අධීක්ෂණය**
බ්‍රිගේඩියර් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ



**උපදේශකත්වය**
ලුතිනන් කර්නල් එස්ජේ කාරියකරවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී - විපාරෙ



**ප්‍රධාන සංස්කාරක**
මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ



**සහාය සංස්කාරක**
කපිතාන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ



**සෝදුපත් කියවීම**
කපිතාන් ඩීඑම් දිල්හාරා සජීවනී - ජාශිබ




# "පවුරේ කීර්තිය" (Wall of Fame) අභිමානය ඇරඹූ වගයි...

ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මෙන්ම විදේශීය ආරක්ෂක විද්‍යාලයක පීඑස්සී උපාධිය සමත් පළමු යුද්ධ හමුදාධිපති වීමේ ගෞරවය වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත හිමිවිය. එම දුර්ලභ අවස්ථාව සනිටුහන් කරමින් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය මගින් කීර්තිමත් පුද්ගලයින්ගේ ඡායාරූ එළිදැක්වීම අරඹමින් එම විද්‍යාලයේ සකසා ඇති "පවුරේ කීර්තිය" (Wall of Fame) හි යුද්ධ හමුදාධිපතිතුමාගේ ඡායාරූපයක් පසුගියදා නිරාවරණය කරන ලදී.

රණවිරුවා

2019 දෙසැම්බර් • 212 කලාපය

2020






## හීන හැබෑවෙන අවුරුද්දක් ...

යුද්ධෙ කාලෙත් මේ වගේම අවුරුදු උදාවුනා. ඒත් සටන් බිම්වල
හිටපු අපිට ඒ කිසිම අවුරුද්දක විශේෂත්වයක් දැනුණෙ
නැහැ. තැන තැන බෝම්බ පිපිරෙද්දි, වෙඩි හඬවල් ඇහෙද්දි
අවුරුදු උදාවක මිහිරියාව සමරන්න අපි කාටත් ඉඩක්
ලැබුණේ නැහැ. අපිට වගේම සාමාන්‍ය ජනතාවටත්
යුද්ධෙ කාලෙ ඒ අවස්ථාව අහිමි වුනා. නමුත් අපි 2009
පස්සෙ ඒ තත්වෙ සහමුලින්ම වෙනස් කළා. හැබැයි
අමතක කරන්න එපා රණවිරුවො හැටියට අපි ඒ
වෙනස වෙනුවෙන් අජීවිතාව ලේ කඳුළු, දහදිය හෙලූ බව.




# "පවුරේ කීර්තිය" (Wall of Fame) අභිමානය ඇරඹූ වගයි...

ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මෙන්ම විදේශීය ආරක්ෂක විද්‍යාලයක පීඑස්සී උපාධිය සමත් පළමු යුද්ධ හමුදාධිපති වීමේ ගෞරවය වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත හිමිවිය. එම දුර්ලභ අවස්ථාව සනිටුහන් කරමින් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය මගින් කීර්තිමත් පුද්ගලයින්ගේ ඡායාරූ එළිදැක්වීම අරඹමින් එම විද්‍යාලයේ සකසා ඇති "පවුරේ කීර්තිය" (Wall of Fame) හි යුද්ධ හමුදාධිපතිතුමාගේ ඡායාරූපයක් පසුගියදා නිරාවරණය කරන ලදී.